# බළන්ගොඩ නගර සභාව

## 2021-07-13 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.07.13**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමී මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රි | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභා වාර්තාව, හා විශේෂ සභාවේ සභා වාර්තා සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021-06-25 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් 2021-06-25 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා විසින් පැවසූවේ (පිටු අංක 29) පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් යටතේ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා කළ කථාවේ සඳහන් "ඩී. එස්. සේනානායක මහතා විසින් 1965 දී හරිත විප්ලවය ආරම්භ කළ බව" යන්න ඩඩ්ලි සේනානායක මැතිතුමා ලෙස සංශෝධනය විය යුතු බවයි.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් තමන් පසුගිය මහ සභාවේදී (පිටු අංක 26) පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් යටතේ "පුද්ගලික පීසීආර් පරීක්ෂණයක් සිදු කිරීමට රු. 6800.00 ක් වැනි මුදලක් වියදම් වන බව" සඳහන්ව ඇතත් දැනට පීසීආර් පරීක්ෂණ ලක්ෂ 36 ක් කර ඇති බවට කළ ප්‍රකාශය සටහන්ව නොමැති බැවින් එය සටහන් කරන ලෙසත් රුපියල් 5000.00 දීමනාව මේ වන විට පවුල් ඒකක ලක්ෂ 76 කට ලබා දී ඇති බවට කළ ප්‍රකාශය සටහන් නොමැති බැවින් එය සටහන් කරන ලෙසත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් (පිටු අංක 09) 04:01:13 යටතේ බැංකියවත්ත, කර්මාන්ත අංශය සඳහා ග්ලවුස් ජෝඩු 47 ක් හා බූට්ස් ජෝඩු 17 ක් මිල දී ගැනීම සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෑතක දී ද මෙම ද්‍රව්‍ය ලබා දුන්නා නේදැයි ප්‍රශ්නයක් විමසූ අතර, එහි දී ගරු සභාපතිතුමා පැවසූවේ මෙම ද්‍රව්‍ය ඉක්මනට විනාශ වන බැවින් සෞඛ්‍යාරක්ෂාව සැලසීම උදෙසා නිරන්තරව මිල දී ගැනීමට සිදුවන බවයි.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා විසින් (පිටු අංක 12) 04:01:07 යටතේ ඉදිරිපත් කර ඇති සෞඛ්‍ය සේවා වියදම් වෙනුවෙන් විශාල මුදලක් වැය කිරීම සම්බන්ධයෙන් විමසූ අතර, ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසූවේ එය 2021-05-06 දින සිට 2021-07-13 දක්වා

මාස දෙකක කාලයකට වැය වූ මුදලක් බවත්, එහි කසළ ඉවත් කිරීමේ ගාස්තු ඇතුලත්ව ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් (පිටු අංක 07)ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වා ඇති බස්නැවතුම්පළ බුදු පිළිමය අසල කුකුල් මස් කඩ කාමරය සම්බන්ධව තමන් ඇසූ ප්‍රශ්නය සටහන්ව නොමැති බව ද හිටපු ආණ්ඩුකාරතුමා විසින් ගෙන ආ මස් මාළු විකිණීමේ ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව මෙම කඩය ඉවත් කර ගැනීම සඳහා සහන කාලයක් ලබා දුන් නමුත් තවදුරටත් එය පවත්වාගෙන යන බව ද පසුගිය සභාවේ දී ද මේ ගැන සාකච්ඡා කළ බව ද පවසන ලදී.

මෙහි දී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පැවසූවේ පසුගිය කාලයේ නඩු දැමීම සඳහා සූදානම් වූ අවස්ථාවේ මෙම කඩය නැවත නොදාන්න පොරොන්දු කරගෙන මාසයක සහන කාලයක් ලබා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉල්ලීමක් කළ බවයි. නමුත් ඉන්පසුව කොරෝනා රාජකාරී කටයුතු හේතුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා සම්බන්ධ කර ගැනීමට නොහැකි වූ අතර ආදායම් පරීක්ෂකට පමණක් මෙම රාජකාරිය කළ නොහැකි බව ද සභාවේ කටයුතු ද දෛනිකව සිදු විය යුතු බැවින් විවේකයක් ලද විගස ආදායම් අංශය ද සම්බන්ධ කරගනිමින් අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට උපදෙස් ලබා දුන් බව ද වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් පැවසූවේ මොවුන් විසින් කී මනි ගැනීමට මාසයක කාලයක් අවශ්‍ය යැයි පැවසීම නිසා මෙන්ම සිංහල අලුත් අවුරුදු සමය පැවති කාලසීමාව යන හේතු පිළිබඳව කාරුණිකව සලකා බලා මාසයක සහන කාලයක් ලබා දෙන ලෙස තමන් ඉල්ලූ අතර, එම සහනයෙන් මේ අය වෙන ප්‍රතිඵල ලබා ගන්නා බැවින් සුදුසු තීරණයක් ඉක්මනින් ගත යුතු බවයි.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තාව ගරු සභාවේ සම්මත විය.**

## 02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන

- ගරු සභාපතිතුමා විසින් නිවේදන වාරය ආරම්භ කරමින් ප්‍රකාශ කළේ සභාවක් ලෙස ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනා ගෞරවාන්විතව රැස් වී ගෞරවාන්විතව හැසිරී මහජනතාවගේ දෛනික හා දීර්ඝකාලීන සේවා සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගෙන අවශ්‍යතා ඉටු කරන බවත්, කුමන දේශපාලන මතිමතාන්දර තිබුණ ද අපගේ ප්‍රධානම කාර්යය විය යුත්තේ මහජනතාවට සේවය කිරීම වන බවත් ය. එමෙන්ම වර්තමානයේ රටේ තත්ත්වය දෙස බැලීමේ දී පැහැදිලි වන්නේ මහජනතාවට විසඳීමට සිදුව ඇත්තේ මහජන මුදලින් නඩත්තු කරන පාලකයන්ගේ ප්‍රශ්න වන අතර, දෛනිකව ජන ජීවිතයට හා සමාජයට අදාල වන රටේ සංවර්ධනය හෝ ජනතාවගේ ආර්ථික තත්ත්වය යන සියලු දේ අමතක වී ඇති බව සඳහන් කළ ගරු සභාපතිතුමා එම තත්ත්වය අපගේ සභාව සඳහා ගෙන ඒමට අවශ්‍ය නැති අතර අපි සියලු දෙනාම හඳුනන සමාජයක් සමඟ ජීවත් වන බැවින් මහජනතාවට සේවය කිරීම අප විසින් කළ යුතු බව වැඩිදුරටත් පැවසීය.

- ජාති, ආගම් හා පක්ෂ භේදයකින් තොරව පැය 24 තුලම නගරයේ රැඳී සිටිමින් නගරයේ සියලු දෙනාගේම ප්‍රශ්න වෙනුවෙන් මැදිහත් වී කැපවීමෙන් කටයුතු කරන බව නගරයේ ජනතාවගෙන් නිරන්තරයෙන් අසන්නට ලැබෙන අතර, ඒ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාට ප්‍රශංසා කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- නිවස ඉදිරිපිට මාර්ගයේ නිසියාකරයෙන් කාණු පද්ධතියක් නොමැති බැවින් මාර්ගයේ ගලා යන ජලය හා කුණු කසළ ගෙමිදුලට පැමිණෙන බව පවසමින් කාණු පද්ධතියක් සකසා දෙන ලෙස බළන්ගොඩ, පල්ලෙවෙල, රාස්සගල පාර, අංක 140/29 බී, "සමන් නිවස" ලිපිනයේ පදිංචි සමන්ත ප්‍රියලාල් ඉන්ද්‍රපාල මහතා විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අදාල ස්ථානය පරීක්ෂා කර බලා කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කර නඩත්තු යටතේ ඉටු කිරීමට හැකියාවක් ඇත්නම් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස පවසන ලදී.

- අධික වර්ෂාව සහිත කාලවල දී නගර සභාව විසින් ඉදිකරන ලද බෝක්කු මතින් උතුරා යන ජලය ඉඩමට ගලා ඒම නිසා ඉඩමෙහි වටිනා ගස් කීපයක් ගලවාගෙන නාය යාමකට ලක් වූ බවත්, නිවසේ පරිහරණයට ගනු ලබන ළිඳ සහිත කොටස වැසී යාමෙන් අසීරු තත්ත්වයට පත්ව ඇති අතර මේ වන විට නිවස ද නාය යෑමේ අවදානමකට පත්ව ඇති බවත්, පවසමින් නිසියාකාරයෙන් ජලය බැස යන පරිදි බෝක්කු සකස් කර දෙන ලෙසත්, නිවස ආරක්ෂා කර ගැනීම සඳහා බැම්මක් සකසා දෙන ලෙසත් ඉල්ලා බළන්ගොඩ, අක්කර 18, අංක 339/32 ලිපිනයේ පදිංචි එන්. අයි. යූ. නානායක්කාර යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහි දී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා පැවසුයේ තමන් වැඩ බලන සභාපතිව සිටි කාලයේ දී වැඩ අධිකාරීතුමා සමඟ මෙම ස්ථානය පරීක්ෂා කළ අතර එහි දී මේ සඳහා විශාල මුදලක් වැය වන බවට හඳුනා ගත් බවයි.

  ඒ අනුව දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව අදාල ස්ථානය පරීක්ෂා කර බලා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට තීරණය විය.

- ඕලුගංතොට, පුරණගෙදර මාර්ගයේ අංක 64/ඒ/2 දරණ ස්ථානයේ පදිංචි එච්.බී.ආර් ඉන්ද්‍රාවතී මහත්මියට අයත් ඉඩමේ පුරණ ගෙදර මාර්ගයට මායිම්ව පිහිටි කොස් ගස් දෙකක් හේතුවෙන් මාර්ගයේ ගමන් කරන ජනතාවට හා වාහනවලට අනතුරු සිදුවන බව ද මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින් එම ගස් ඉවත් කර ගත යුතු බවට සලකුණු කර ඇති බව ද සඳහන් කරමින් එම ගස් දෙක නොපමාව ඉවත් කර දෙන ලෙස ඉල්ලා බළන්ගොඩ,

ඕලුගංතොට, පුරණගෙදර පාර ලිපිනයේ පදිංචි ඩී. පී. ආරච්චි යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

කාර්මික නිලධාරීන් විසින් අදාල ස්ථානය පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කිරීමට තීරණය විය.

- කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් පෞද්ගලික පන්ති නොපැවැත්වීම නිසා ආදායමක් නොමැති බව පවසමින් 2020 හා 2021 වර්ෂයට අදාලව ගෙවූ ව්‍යාපාර බදු මුදල් නැවත ලබා දෙන මෙන් ඉල්ලා බළන්ගොඩ, තුඹගොඩ, බුද්ධ ජයන්ති මාවත, නො.21"සීගිරි", ලිපිනයේ එම්. ඒ. රංජනී සමගිලතා පෙරේරා යන විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහි දී අදහස් දක්වමින් ගරු සභාපතිතුමන් පැවසූවේ රජයේ ආදායමට බැර කර ඇති නිසා නැවත ගෙවීමේ ගැටලුවක් පවතින බැවින් ගෙවීමට නොහැකි බව දන්වා පිළිතුරු ලිපියක් යොමු කරන ලෙසයි.

- ඉඩම මිල දී ගන්නා අවස්ථාවේ දී වැසි ජලය බැස යාමට නෙත්ති කාණුවක් තිබුණු අතර යාබද නිවෙස් හිමියන් විසින් සිදු කරන ලද ඉදි කිරීම් හේතුවෙන් එම නෙත්ති කාණුව වැසී ඇති බැවින් වර්ෂා කාලයේ දී නිවස වැසි ජලයෙන් යටවෙන බව පවසමින් වැසි ජලය බැස යාමට සුදුසු ඉඩක් ලබා දෙන ලෙස ඉල්ලා බළන්ගොඩ, රාස්සගල පාර, අංක 90/10 ඒ ලිපිනයේ පදිංචි එන්. එල්. චමින්ද අරුණශාන්ත යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  කාර්මික නිලධාරීන් විසින් අදාල ස්ථානය පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව තීරණයක් ගැනීම සුදුසු බව තීරණය විය.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

04:01 කර්මාන්ත අවශ්‍යතා සඳහා අවශ්‍ය තාර බැරල් 50ක් මිලදී ගැනීම සඳහා වූ මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව පහත සඳහන් ආයතන 03න් මිල ගණන් ඉදිරිපත් වූ අතර, අවම මිල ගණන ඉදිරිපත් කළ Bitulink ආයතනයෙන් තාර බැරල් මිල දී ගැනීම සඳහා ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

- Bitumix - රු. 18,460.00
- G.K.U.C International - රු. 19,440.00
- Bitulink - රු. 18,399.00

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 05. කල් දී ඇති ප්‍රශ්න

### 05:01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

05:01:01 ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරන කොම්පෝස්ට් පොහොරවල ගුණාත්මකභාවය සහ නිෂ්පාදනය ඉහළ නැංවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

කොම්පෝස්ට් පොහොරවල ගුණාත්මකභාවය වැඩි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග

- ගොඩ ක්‍රමය යටතේ නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර සඳහා ගොඩ සාදන මුල් අවස්ථාවේ දීම අදියර වශයෙන් ග්ලිරිසීඩියා, වල් සූරියකාන්ත සහ අනෙකුත් නයිට්‍රජන් අනුපාතය ඉහළ අමු කොළ එක් කිරීම
- ගොඩ ක්‍රමය සැකසීමේ මුල් අදියරේ දීම ERP හෙවත් පොස්පේට් එක් කිරීම තුලින් පොහොර ප්‍රමිතිය ඉහළ නැංවීමට කටයුතු යොදා ඇත.
- ගොඩෙහි උස, පළල සහ දිග යම් දුරකට වෙනස් කිරීම සිදු කිරීම
- ගොඩ පෙරලීම මීට පෙර සිදු කරන ලද්දේ සති දෙකකට වරක් වන අතර, පසුව එය සති 03 කට වරක් ලෙස වෙනස් කරනු ලැබුවේ එහි ජීර්ණ කාලය වෙනස් වීම තුලින් පොහොර ප්‍රමිතිය උසස් කිරීම සඳහා ය.
- මෙම සියලු කරුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශකවරුන්ගේ නිරන්තර අධීක්ෂණය හා උපදෙස් මත සිදු කරනු ලැබේ.

පොහොර නිෂ්පාදනය ඉහළ නැංවීමට ගෙන ඇති ක්‍රියාමාර්ග

- දූනට අප සතුව ඇති කසළ කැබලි කිරීමේ යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට ආයතනයට ලබා දී ඇත.
- අබලි විකුණුම්කරුවන් වෙත ද පොහොරවල ගුණාත්මක බව පිළිබඳ දැනුවත් කර ඔවුන්ට පොහොර අලෙවි කිරීම
- තේ දලු රැගෙන යන වතු හිමියන් දැනුවත් කර ඔවුන්ට පෙහොර අලෙවි කිරීම
- කෘෂිකර්ම උපදේශක මහතා දැනුවත් කර එම උපදේශක මහතා හරහා ප්‍රදේශයේ ගොවි මහතුන්ට පොහොර පිළිබඳ දැනුවත් කිරීම සිදු කරන ලෙස දැන්වීම

මෙහි දී අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසූවේ අප සභාවේ කණ්ඩායමක් වෙනුවෙන් මෙම මාසයේ මුල් දිනක මාකඳුර කොම්පෝස්ට් පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුවක් ලබා දීමට කටයුතු සූදානම් කර තිබුණ ද ගරු ජනාධිපතිතුමා එම ස්ථානයේ නිරීක්ෂණ චාරිකාවකට සහභාගී වූ නිසා එම අවස්ථාව අහිමි වූ නමුත් කඩිනමින් අදාල පුහුණුව සඳහා මෙම කණ්ඩායම සහභාගී කරවීමට කටයුතු කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කොම්පෝස්ට්වල වැලි සාන්ද්‍රණය වැඩි වීමට හේතුව විමසීය. මේ සම්බන්ධව පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූවේ ට්‍රැක්ටරය මඟින් කසළ එකතු කරන තුරු වීදි කසළ අතු ගා යම් වේලාවක් ඒ ඒ ස්ථානවල තිබීමේ දී සුළඟට යාමත්, කොළ රොඩු එකතු කිරීමට තහඩු භාවිත කිරීමත් නිසා වැලි, පස් එමගින් එකතු වන බවයි. එමෙන්ම මෙය වළක්වාලීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇති අතර, ඒ අනුව අතු ගාන අවස්ථාවේදීම කසළ එකතු කිරීමට ට්‍රැක්ටරයක් යෙදවීමට කටයුතු කර ඇති බවත්, මෙය ආරම්භ කර කෙටි කාලයක් වන බැවින් ප්‍රතිඵලය දැන ගැනීමට යම් කාලයක් ගත වන බවත්, ඉදිරියේ දී මේ සඳහා යම්කිසි යන්ත්‍රයක් තිබේ නම් එම යන්ත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බවත් වැඩිදුරටත් පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින් කොම්පෝස්ට්වල නයිට්‍රජන් ප්‍රතිශතය වැඩි කිරීමට ගෙන ඇති පියවර කුමක්දැයි විමසීය.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, මීට පෙර මස් හා මාළු අපද්‍රව්‍ය කොටස් නයිට්‍රජන් ප්‍රතිශතය වැඩි කර ගැනිමට යොදා ගත් නමුත් වර්තමානයේ දී පත් කර එවා ඇති පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම පර්යේෂක නිලධාරීන් දෙදෙනාගේ උපදෙස් මත කොම්පෝස්ට් ක්‍රියාවලිය සඳහා ශාක කොටස් එකතු කර ගැනීමටත්, දිරපු කොම්පෝස්ට් කොටස් නැවත මිශ්‍ර කිරීමටත් කටයුතු කරන බව පැවසීය.

නැවතත් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින් එකතු කරනු ලබන පොස්පේට් ප්‍රමාණය වෙනස් වීමට හේතු විමසූ අවස්ථාවේ දී ගරු සභාපතිතුමා පැවසූයේ භාවිත කරන ප්‍රතිශතයේ වෙනසක් සමඟ ඉදිරියට යාමට බලාපොරොත්තු වන බවයි. එහි දී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් කොම්පෝස්ට් මුල් අවස්ථාවේ දීම පොස්පේට් එකතු කිරීමෙන් ජීර්ණය හොඳින් සිදුවන බවත්, හිටපු සභාපතිතුමාගෙ කාලයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය අද වන විට තාක්ෂණිකව හා යාන්ත්‍රිකව දියුණු වී නොමැති අතර, කොම්පෝස්ට් ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් වෙනුවෙන් සියලු දෙනාගේම සහය ලබා දෙන බවත් පැවසීය.

මෙහි දී අදහස් දක්වමින් ගරු සභාපතිතුමා, තමන් ආයතන ප්‍රධානියා වශයෙන් ආයතනයේ සියලුම අංශ දියුණු කිරීමට නිරන්තරයෙන් උත්සාහ ගන්නා බව ද පළාත් පාලන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සංවර්ධනය වෙනුවෙන් ව්‍යාපෘති යෝජනා කිහිපයක් සකස් කර ඉදිරිපත් කර ඇති බව ද අරමුදල් ප්‍රශ්න පවතින බව ද සඳහන් කළේය. එමෙන්ම පසුගිය කොරෝනා ව්‍යාප්තියට පෙර ඒ ඒ කොට්ඨාස නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් සම්බන්ධ කරගනිමින් කසළ වර්ග කර එකතු කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ නමුත් කොරෝනා ව්‍යාප්තියත් සමඟ එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව ද වර්තමානයේ ඉල්ලන ප්‍රමිතියට ගැලපෙන පරිදි නවීන තාක්ෂණය සමගින් කොම්පොස්ට් නිෂ්පාදනය කරන බව ද වැඩිදුරටත් පැවසීය.

මේ සම්බන්ධව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා පැවසූවේ රජය විසින් පුද්ගලික අංශවලට පවා ආධාර ලබා දෙන බැවින් පළාත් පාලන ආයතනවලට ද ආධාර ලබා ගැනීමට හැකි බවයි.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පළාත් පාලන ආයතන කොම්පෝස්ට් පිළිබඳව හිතලවත් නැති කාලෙක ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලින් 80%ක් පුහුණුවීම සඳහා බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට පැමිණි බව ද ලක් පොහොර සඳහා අපගේ නිෂ්පාදන ලබා ගත් බව ද පැවසීය. එමෙන්ම

පොහොරවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා කුඩා පර්යේෂණාගාරයක් සකස් කිරීම මගින් ගුණාත්මකභාවය පිළිබඳව වෙබ් අඩවි හරහා දැනුවත් කිරීම කළ හැකි බව ද එමගින් නිෂ්පාදනය වැඩි දියුණු කර විශාල ආදායමක් ලබා ගත හැකි බව ද රජයේ අනුග්‍රහය මේ සඳහා ලබා ගත හැකි අතර, ගරු අමාත්‍ය ජානක වක්කුඹුර මැතිතුමාගේ සහය ලබා ගැනීමට හැකියාවක් පවතින බැවින් ව්‍යාපෘති යෝජනා සකස් කර ලබා දෙන ලෙස දවැඩිදුරටත් පවසන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පැවසුවේ අප නිෂ්පාදනය කරනු ලබන පොහොර මිල දී ගන්නා ආයතනයන් එම පොහොරවල ප්‍රමිතිය පිළිබඳව පරීක්ෂා කරන අතර එම වාර්තා ඉතා හොඳ තත්ත්වයේ පවතින බවයි. විශේෂයෙන් සී.අයි.සී ආයතනය මෙම පොහොරවල ගුණාත්මකභාවය පිළිබඳ පරීක්ෂාවන් සිදු කළ අතර, ප්‍රමිතියකින් යුත් බැවින් ගිවිසුම් ගත වීමට බලාපොරොත්තුවෙන් සිටින බවද පවතින සුළු සුළු අඩුපාඩු සකස් කර ගනිමින් පවතින ඉල්ලුමට සරිලන පරිදි තවදුරටත් වැඩි දියුණු කිරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කල යුතු බව ද වැඩිදුරටත් පැවසීය.

05:01:02 අනතුරුදායක ගස් කපා ඉවත් කිරීමේ නියෝගය ලබා දීමේ දී සභාවට අය කරනු ලබන ගාස්තුව කුමක් ද?

පරීක්ෂණ ගාස්තු වශයෙන් රුපියල් 500.00 ක මුදලක් අය කරනු ලබයි.

**05:02 ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

05:02:01 හුණුකුඹුර හා කෝපිවත්ත, සුදර්ශනගම මාර්ගවල දිරන ලද ලයිට් කණු ඉවත් කර කොන්ක්‍රීට් කණු ලබා දෙන මෙන් ඉල්ලා තිබූ යෝජනාවේ වර්තමාන තත්ත්වය කෙසේද?

විදුලි බල මණ්ඩලය දැනුවත් කර ඇත.

05:02:02 පෙර පාසල් පාලිකා බඳවා ගැනීමේ වර්තමාන තත්ත්වය කෙසේද?

පෙර පාසල් පාලිකා බඳවා ගැනීමේ වර්තමාන තත්ත්වය පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව නගර සභා පෙර පාසලේ සේවය කරන ශ්‍යාමා සිරිනිශාන්ති මහත්මියට ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමාගේ දීමනාව හැර අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් 16 දෙනාගේ දීමනාවෙන් රු. 10,000.00 ක මුදලක් මාසිකව ලබා දීමට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු උප සභාපති එම්. ටී.එම් රුමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:02:03 සේවා ගිවිසුම් මත මේ වන විට කීදෙනෙක් බඳවා ගෙන සිටිනවාද?

සේවා ගිවිසුම් මත 04 දෙනෙකු බඳවා ගෙන ඇත.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා නැවත ප්‍රශ්නයක් සභාවට යොමු කළ අතර, එහි දී සභාව සතු දේපල ලේඛනයේ පිට්ටනියට යාබද පරණ කුණු කසල බැහැර කළ ඉඩම ගැන සඳහන් නොවීම ගැන හේතුව විමසීය.

මේ සම්බන්ධව කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

මෙහි දී අදාල ඉඩම් කොටස පවරා ගැනීමේ කටයුතු කඩිනමින් කර දෙන ලෙස සම්බන්ධීකරණ කමිටුව වෙත ඉල්ලීමක් කිරීමට තීරණය විය.

**05:03 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

05:03:01 අප නගර සභාවෙන් නඩත්තු කටයුතු කිරීමේ දී ඉවතලන ගස් අතු තණකොළ ප්‍රදේශයේ කුඹුරු අයිතිකරුවන්ට සහ (කොම්පෝස්ට්) කාබනික පොහොර නිෂ්පාදකයින් වෙත ලබා දිය හැකි ද?

ලබා දිය හැකියි.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා නගර සභාවෙන් නඩත්තු කටයුතු කරන ස්ථාන හා දිනයන් ගැන දැනුවත් කිරීමට කටයුතු සලසා දෙන ලෙස පැවසීය.

05:03:02 ටෙලිකොම් කණු සහ ඩයලොග් කණු නගරයේ සෑම තැනම ඉතාම කරදරකාරී අයුරින් ස්ථාපනය කර ඇත. දැනටමත් එය එසේ සිදුවෙමින් පවතී. මීට කලින් මෙම සභාවේ මෙම දැනුවත් කිරීම කරන ලදී. එයට ගත් පියවර කුමක් ද?

මේ වන විට අදාල ආයතන දැනුවත් කර තිබෙන බව පැවසූ ගරු සභාපතිතුමා ඉදිරියේදී මෙම ආයතන ගෙන්වා සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

06:01:01 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| A 4 Paper | බන්ඩල් 100 |
| හරස් සටහන් පොත් | 50 |
| අතිකාල දීමනා කොළ | 1000 |
| වවුචර් | 1000 |
| ග්ලාස් ක්ලීනර් (ලීටර්) | 10 |
| Finol කෑන් | 10 |

| | |
|---|---|
| Lifeboy සබන් (ලොකු) | 500 |
| Air freshner | 10 |
| CR I | 20 |
| CR II | 20 |
| CR IV | 10 |
| Printed Envelop | 1000 |
| Normal File | 500 |
| පොඩි ලියුම් කවර | 1000 |
| ගමන් වියදම් කොළ | 1000 |
| ලීගල් කොළ | බන්ඩල් 03 |
| A 3 කොළ | බන්ඩල් 01 |
| හාෆ්ෂීට් | බන්ඩල් 05 |
| 255 A Toner | 05 |
| 285 A Toner | 10 |
| LQ 2090- Ribben | 03 |
| CFL බල්බ් (වොට් 30) Screw Type (වීථි පහන් නඩත්තු) | 250 |
| සෙරමික් හෝල්ඩර් Screw Type (වීථි පහන් නඩත්තු) | 100 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 බැංකියවත්ත පොහොර ඇසුරුම් කිරීම සඳහා ලිනරය සමඟ මුද්‍රිත පොහොර කවර මිල දී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- කි. ග්‍රෑම්. 25 - ප්‍රමාණය (7000)
- කි. ග්‍රෑම්. 50 - ප්‍රමාණය (5000)
- කි. ග්‍රෑම්. 10 - ප්‍රමාණය (2000)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06፥01፥03 පොහොර සැකසීමට අවශ්‍ය පොස්පේට් කි.ග්‍රෑම් 50 මිටි 500 ක් මිල දී ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06፡01፡04 කොම්පෝස්ට් පොහොර කි. ග්‍රෑම් 01 ක මිල රු.10.00 දක්වා වැඩි කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පොහොර මිල වැඩි කිරීමට හේතුව කුමක්දැයි විමසන ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා පැවසුවේ කොම්පෝස්ට් පොහොර ටොන් 01 ක් නිෂ්පාදනය කිරීමට රුපියල් 27,000.00 ක මුදලක් වැය වන අතර, ටොන් 01 කින් ලබන ආදායම රු.5,000.00 ක් වන නමුත් මෙහි දී ආදායම හෝ වියදම ගැන නොව සපයනු ලබන සේවාව ගැන සැලකිල්ල යොමු කරන බවයි. මීට පෙර පොහොර කි.ග්‍රෑම් 01 ක් රුපියල් 10.00 ක මුදලකට අලෙවි කළ ද පසුගිය කොරෝනා වසංගත කාලය තුල ගෙවතු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා එය රුපියල් 05 දක්වා අඩු කිරීමක් සිදු කරන ලද බව ද වර්තමානයේ යම් යම් ආයතනයන් ගිවිසුම්වලට පැමිණ රුපියල් 5.00 මිලට පොහොර මිල දී ගෙන පිටත ප්‍රදේශයන් වෙත රුපියල් 25.00 ට හා රුපියල් 30.00 ට වශයෙන් විකුණන බවද මේ නිසා අතරමැදියන් විශාල ආදායමක් ලබන බව ද පැවසූ ගරු සභාපතිතුමා පැල්මඩුල්ලෙහි කොම්පෝස්ට් කි. ග්‍රෑ 01 ක් රුපියල් 20 කට අලෙවි කරන බව ද බළන්ගොඩ රුපියල් 5.00 ට විකුණන්නේ ඇයිදැයි ඔවුන් අපෙන් ප්‍රශ්න කරන බව ද පැවසීය.

එමෙන්ම දෛනික වැටුප්, ඉන්ධන, ගලි ප්‍රතිකාරක පද්ධතිය ආදිය සඳහා විශාල වියදමක් දැරීමට සිදුව ඇති අතර, පොහොරවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ දී නිෂ්පාදනය සඳහා තවත් විශාල වියදමක් වැය වෙන බවත්, අද වන විට වෙස් වලාගත් ආශිර්වාදයක් ලෙස කාබනික පොහොර සඳහා ඉල්ලුමක් ඇති වී තිබෙන බැවින් මේ සියලුම කාරණා ගැන සලකා බලා පොහොර කි.ග්‍රෑ 01 ක් රුපියල් 10.00 ට වැඩි කිරීම සුදුසු බව පවසන ලදී. මීට අමතරව සීඅයිසී ආයතනය අප සමග ගිවිසුම් ගත වී නිෂ්පාදනය කරන සම්පූර්ණ පොහොර ප්‍රමාණය ලබා ගැනීමට සාකච්ඡා කර ඇති අතර, ඔවුන්ට රුපියල් 5.00 බැගින් පොහොර ලබා දීම විශාල පාඩුවක් බව ද ගරු සභාපතිතුමා වැඩිදුරටත් පැවසීය.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා බළන්ගොඩ නගර සභාව කිරුළ පැළඳුවේ කොම්පෝස්ට් නිෂ්පාදනයට නොව හොඳම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට බව ද කොම්පෝස්ට් යනු එහි අතුරුඵලයක් පමණක් බව ද අතිගරු ජනාධිපතිතුමා විසින් කාබනික පොහොර ප්‍රවර්ධනය කරන මෙවන් අවස්ථාවක රුපියල් 5.00 ට තිබෙන පොහොර රුපියල් 10.00 දක්වා වැඩි කිරීමට තමන් විරුද්ධ බව ද ඒ ගැන මතයක් තිබේනම් බෙදීමකට යාමට තමන් සූදානම් බව ද එහි දී තනියම හෝ විරුද්ධ වන බව ද පැවසූ අතර, පසුගිය කාලයේ වැසිකිලි පිරිසිදු කරන පුද්ගලයාගේ දීමනාව වැඩි කිරීමට කතා කළ අවස්ථාවේ දී එය ගැසට් කර තිබෙන බව පැවසූ පරිදි පොහොර මිල සම්බන්ධව ගැසට් කර තිබෙන්නේ දැයි විමසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අද සභාව ආරම්භ කළ අවස්ථාවේ සිටම කොම්පෝස්ට් ව්‍යාපෘතියේ දියුණුවක් නැති බව පවසමින් ඔබතුමන්ලා දොස් නැගුව නමුත් හිටපු ගරු ආණ්ඩුකාරතුමා සහ වර්තමාන ගරු ආණ්ඩුකාරතුමා ලබා දුන් යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් හැරුණු

කොට මෙය දියුණු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන මේ වන තෙක් රජයෙන් ලැබී නැති බව ද මෙම මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය කරන වැඩි දියුණු කිරීම් සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇති බව ද මීට පෙර පැවති මිලට නැවත ගෙන ඒමේ අසාධාරණයක් නොමැති බව ද පැවසීය. එමෙන්ම ගැසට් කළ මුදලක් සභාවේ එකඟතාවය මත වෙනස් කළ හැකි අතර, වැසිකිළි දීමනාව සම්බන්ධව සාධාරණව බැලූ ආකාරයට මේ දෙස ද සාධාරණව බලන ලෙසත් අප සභාවට ආදායම අහිමි වී යන කාලයක් බැවින් මෙම මුදල වැඩි කිරීමට අවශ්‍ය සහයෝගය ඉතාමත් ගෞරවයෙන් අපේක්ෂා කරන බව ද පැවසූ ගරු සභාපතිතුමා එසේ නොවුනහොත් ඉදිරියේ දී මෙම කොම්පෝස්ට් ව්‍යාපෘතිය නඩත්තු කරගෙන යාමට අසීරු තත්ත්වයක් ඇති වී රජයෙන් ආධාරයක් එනතුරු බලා සිටීමට සිදු විය හැකි බව ද පැවසීය.

මෙහි දී නැවත වරක් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් තමන්ගේ පුද්ගලික මතය මෙම අවස්ථාවේ ඉදිරිපත් කළ අතර පුද්ගලිකවම මෙම පොහොර මිල වැඩි කිරීම සම්බන්ධව තමා විරුද්ධ වන බව ද 2021-12-31 වන තෙක් රුපියල් 5.00 මිලට පවත්වා ගෙන යන ලෙස ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය ද 2021-12-31 වන තෙක් රුපියල් 5.00 මිලට පවත්වාගෙන ගොස් ඉන්පසුව තීරණයක් ගැනීමට යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය ද පොහොරවල ගුණාත්මකභාවය වැඩි කිරීමෙන් අනතුරුව රුපියල් 10.00 ට වැඩි කිරීමට යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය රුපියල් 20.00 දක්වා මිල වැඩි කිරීමට යෝජනා කරන ලදී. මෙහි දී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ පසුගිය සභාවේ දී ඉන්ධන මිල වැඩියි පොහොර මිල වැඩියි කියමින් කෑ ගැසූ ගරු මන්ත්‍රීවරුන් අද දින පොහොර මිල වැඩි කිරීමට කැමැත්ත ප්‍රකාශ කල බවයි.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් කාබනික පොහොර සීඅයිසී ආයතනයට නොදී දෙසැම්බර් මාසය අවසන් වනතෙක් බළන්ගොඩ ගොවීන්ට ලබා දෙන ලෙසත්, සී අයි සී ආයතනය සමඟ ලබන වසරේ ගිවිසුමකට යන ලෙසත් පවසන ලදී. එමෙන්ම කොම්පෝස්ට් නිෂ්පාදනයේදී කෙසෙල් නැටි මඟින් නයිට්‍රජන් ලබා ගැනීමට හැකි අතර, විශාල කෙසෙල් ප්‍රමාණයක් බළන්ගොඩ මහජන පොළට පැමිණෙන බැවින් එම කෙසෙල් නැටි මේ සඳහා යොදා ගත හැකි බවත් කෙසෙල් නැටි කැබලි කිරීමට හා අතුකොළ කැපීමට යන්ත්‍ර දෙකක් ගත් බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී වීරසිංහ මැතිතුමා පොහොර රුපියල් 5.00 ලබා දීමට යෝජනා කළ අවස්ථාවේ ගොවියන්ට වන සහනය මත කැමැත්ත ලබා දුන් අතර, එක්වරම මිල වැඩි කිරීම නිසා ගොවියන්ට සිදුවන අසාධාරණය හේතුවෙන් විරුද්ධ වන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් කුඹුරු ගොවීන් පොහොර නොමිලේ ලබා ගැනීමට හැකියාවක් තිබේදැයි තමන්ගෙන් විමසූ බවත් රටේ පවතින තත්ත්වය සලකා දෙසැම්බර් වන තෙක් පවතින මිලට ලබා දෙන ලෙසත් පවසන ලදී.

මෙහි දී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී වීරසිංහ මැතිතුමා ගොවියාට සහ ආයතනය යන දෙපිරිසටම සාධාරණයක් වන ලෙස මුදලක් තීරණය කිරීමට යෝජනා කරන ලදී.

ඒ අනුව ගරු උපසභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් රටේ අර්බුදයක් පවතින අවස්ථාවක් බැවින් 2021 දෙසැම්බර් 31 දක්වා පොහොර කි.ග්‍රෑම් 01 ක මිල රුපියල් 8.00 දක්වා වැඩි කිරීමට යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී වීරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා සී අයි සී ආයතනයට පොහොර ලබා දීම සම්බන්ධව තීරණය කුමක් දැයි විමසන ලදී. ඒ අනුව සී අයි සී ආයතනයට ලබා දීමට ප්‍රමාණවත් නිෂ්පාදනයක් පවතී නම් ලබා දීම සඳහා එකඟතාවය පළ විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 බැංකියවත්ත පොහොර හලන යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය දික් අඩි 100 ක දැලක් මිල දී ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 2021-06-28 දින ජේ.සී.බී යන්ත්‍රය ලබා ගැනීම වෙනුවෙන් චම්පික ප්‍රසාද් ජයසිංහ යන අය විසින් රු. 4800.00 ක මුදලක් තැන්පත් කර ඇති අතර, අදාල සේවාව ලබා නොගත් බැවින් එම මුදල ආපසු ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව එම මුදල ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- බැංකියවත්ත සේවකයන් සඳහා ගම් බූට්ස් මිල දී ගැනීම වෙනුවෙන් රු.23,500.00 මුදල පී.එම්.කේ. හාඩ්වෙයාර් ආයතනය වෙත ගෙවීම.
- බැංකියවත්ත වහල සඳහා ජී අයි පයිප්ප මිලදී ගැනීම වෙනුවෙන් රු.25,800.00 ක මුදලක් පී.එම්.කේ. හාඩ්වෙයාර් ආයතනයට ගෙවීම.
- බැංකියවත්ත සඳහා වොට් 50 - LED බල්බ් මිලදී ගැනීම වෙනුවෙන් සිටි ඉලෙක්ට්‍රිකල්ස් ආයතනය වෙත රු.13,500.00 ක මුදලක් ගෙවීම.
- කම්බි ප්ලේට් සෑදීම හා කැඩී ඇති ස්ථාන සැකසීම වෙනුවෙන් ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා පී.එම්.කේ. හාඩ්වෙයාර් ආයතනය වෙත රු. 24,400.00 ක මුදලක් ගෙවීම.
- කාර්යාලයීය නිලධාරීන් සඳහා ෆේස් ෂීල්ඩ් හා ගබඩාව සඳහා ඩස්පෑන් මිල දී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් ආයතනය වෙත රු.26,800.00 ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- ගබඩා අවශ්‍යතා හා සෞඛ්‍ය අංශය අංශයට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් ආයතනය වෙත රු. 167,047.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම
- බැංකියවත්ත හලර් යන්ත්‍රය අලුත්වැඩියා සඳහා දැල් ඇතුළු ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ. හාඩ්වෙයාර් ආයතනය වෙත රු.13,670.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම
- කාර්යාලයට අවශ්‍ය රිසිට් පොත් 200 ක් පිටපත් 03ක් සහිතව මුද්‍රණය කිරීම වෙනුවෙන් කරුණාරත්න ප්‍රින්ටර්ස් ආයතනය වෙත රු. 102,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- කර්මාන්ත අවශ්‍යතා සඳහා අවශ්‍ය කම්බි/සිමෙන්ති ඇතුළුව බැංකියවත්ත පොහොර හලනය සඳහා ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ. හාඩ්වෙයාර් ආයතනය වෙත රු.132,115.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම
- RB 4786 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු. 25,600.00 ක මුදල ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම
- RC 1107 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු. 20,020.00 ක මුදල ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2021-06-28 | ලංකා විදුලි බල මණ්ඩලය - 2021 ජූනි මස කාර්යාලය, නගර සභා යාබද ගොඩනැගිල්ල විදුලි බිල ගෙවීම | 52 | 066600 | 19,688.25 |
| 2021-06-28 | නිපුන උත්සව භාණ්ඩ හා කේටරින් - තුරු උයන ඇවිදින මංතීරු උත්සවය සඳහා හට් සහ කවර් කරන ලද පුටු ලබා ගැනීම | 59 | 066602 | 13,000.00 |
| 2021-04-27 | අප්‍රේල් මස සභාව සඳහා දිවා ආහාර සැපයීම - බළන්ගොඩ තානායම | 68 | 066608 | 12,500.00 |
| 2021-07-01 | බී. කේ. ජේ. එස්.අමරදාස - ඉන්ධන බිල්පත් පියවීම 2021-05-03 සිට 2021-05-31 දක්වා | 01 | 066621 | 147,040.00 |
| 2021-07-01 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-06-16 සිට 2021-06-30 දක්වා නගරයේ කසළ ඉවත් කිරීම | 02 | 066622 | 313,624.01 |
| 2021-07-07 | ලැයිම් කාමර 10 කාණුව සඳහා 1/2 ප්ලයිවුඩ් බෝඩ් 04ක් මිල දී ගැනීම - සෙවන ග්ලාස් හවුස් | 23-1 | 066635 | 11,960.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 මාලු කඩ කාමර අංක 09 හා 10 හැර ඉතිරි මාලු කඩ ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ පළාත් පාලන ආයතනයක් වශයෙන් බළන්ගොඩ නගර සභාව සතු සියලුම මස් හා මාලු කඩ වාර්ෂිකව ටෙන්ඩර් කළ යුතු අතර, මෙසේ වාර්ෂිකව ටෙන්ඩර් කරගෙන ඒමේ දී මාලු කඩ කාමර අංක 09 හා 10 කඩවල වෙළඳාමේ නිරත අය විසින් චක්‍රලේඛයක් පදනම් කරගෙන මෙම කඩ ටෙන්ඩර් කළ නොහැකි බවට නඩුවක් හිටපු ගරු සභාපතිතුමාගේ කාලයේ දී ගොනු කළ බවත්, එම නඩුව වසර 30කට ආසන්න කාලයක් තිස්සේ පවතින බවත් ය. එබැවින් මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් විමසූ බව ද එහි දී පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක CLG/LG-5/2/1/2 – (ii වෙළුම ) හා CLG/LG-5/2/1/2 ලිපි මගින්, නඩු කටයුතු සඳහා සභාව පාර්ශවයෙන් පෙනී සිටින නීතිඥතුමාගේ උපදෙස් මත අංක 09 හා 10 යන කඩ කාමර සඳහා කුලිය අය කර ගැනීමට අදාල කටයුතු සිදු කරන ලෙසත්, අංක 09 හා 10 හැර ඉතිරි කඩ කාමර ටෙන්ඩර් කරන ලෙසත්, දැනුම් දුන් බව ද ඒ අනුව මාලු කඩ කාමර අංක 09 හා 10 හැර ඉතිරි මාලු කඩ ටෙන්ඩර් කිරීම කළ යුතු බවට තමන් යෝජනා කරන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මාලු කඩ කාමර අංක 09 හා 10 හැර ඉතිරි මාලු කඩ ටෙන්ඩර් කිරීම මගින් ඉතිරි මාලු කඩ සඳහා යම් අසාධාරණයක් සිදු වන බැවින් නඩු තීන්දුව ලැබෙන තුරු ඉතිරි මාලු කඩ ටෙන්ඩර් කිරීම නොකළ යුතු බව පැවසීය.

මෙහි දී අදහස් දෙකක් ඉදිරිපත් වීම නිසා 06:01:09 මාලු කඩ කාමර අංක 09 හා 10 හැර ඉතිරි මාලු කඩ ටෙන්ඩර් කිරීමේ යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය යෝජනා කල අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙම යෝජනාවට පක්ෂ හා විපක්ෂ බව තීරණය කිරීමට ඡන්දයක් විමසීමට සිදු වන බැවින් ඒ සඳහා ඡන්දයක් විමසන ලදී.

එහිදී 06:01:09 යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් දෙදෙනෙකුද, එනම්,

| | |
|---|---|
| 01. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී.පේමදාස මැතිතුමා ද |

ඒ සඳහා විපක්ෂව ගරු සභිකවරුන් හතර දෙනෙකුද, එනම්,

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 03. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ද |

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි ගරු සභිකවරුන් එකලොස් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 01. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රිනී | ජී.චන්ද්‍රලතා මැතිතුමිය |
| 08. ගරු නාගරික මන්ත්‍රිනී | එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය |
| 09. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |

ඡන්දය ප්‍රකාශ කරන ලද අතර ඒ අනුව 06ඃ01ඃ09 යෝජනාව වැඩි ඡන්ද දෙකකින් පරාජයට පත් වූ බැවින් සභා සම්මත නොවීය. කෙසේ වෙතත් මෙහි වගකීම සියලු දෙනාටම බෙදෙන බැවින් එය සිහියේ තබා ගන්නා ලෙස ගරු සභාපතිතුමා වැඩිදුරටත් පැවසීය.

06:01:10 සභාව භුක්ති විඳින රජයේ ඉඩම් සඳහා පැවරුම් නියෝග ලබා ගැනීමට සභා තීරණයක් ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 2021 අගෝස්තු මස සභාවේ ගරු සභිකරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 බළන්ගොඩ තානායම නැවත විවෘත කිරීමට හැකි බැවින් සභාව වෙත ලබා දී ඇති යතුරු හා ලිපිලේඛන නැවත ලබා දෙන මෙන් ඉන්දික එරික් සිසිල් යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපියට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මේ වන විටත් යතුරු ලබා දීමට කටයුතු කර ඇති බව ද සුරාසැල විවෘත කිරීම සඳහා සුරා බදු ස්ථානාධිපතිගේ ලිපිය මගින් සිදු කළ දැනුම් දීම මත යතුරු බාර දුන් බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 2020-12-31 අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණන මතය සභාවට ඉදිරිපත් කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 2021-07-13 දින සිට 2021-08-10 දක්වා සෞඛ්‍ය සේවා සඳහා වියදම් ඇස්තමේන්තුව වන රු. 1,634,309.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 2021 අගෝස්තු මස සභාවේ නිලධාරීන්ගේ අතිකාල හා ගමන් වියදම් ඇස්තමේන්තුව සඳහා රු300,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 2021-07-13 දින සිට 2021 අගෝස්තු මස සභාව පැවත්වෙන දින දක්වා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රු.50,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ17 2021-07-13 දින සිට 2021 අගෝස්තු මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ හදිසි වාහන අලුත්වැඩියා කටයුතු සඳහා රු.300,000.00 මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ18 2021-07-13 දින සිට 2021 අගෝස්තු මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ හදිසි යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා රු.75,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 2021 ජූලි මස ගෙවිය යුතු දේශීය ණය සහ සංවර්ධන අරමුදල මඟින් බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය වාරිකය ලෙස රු.769,680.36 මුදලක් ද, වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය ලෙස රු.202,918.84 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 සතිපොළ ආපන ශාලාව හා දන්වීම් පුවරු 10 ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාලව කුලී හා ගාස්තු අඩු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 2021 මැයි සිට 2021 ජූනි මාසය දක්වා කඩ කුලී හා වැසිකිළි ගාස්තු අය කිරීම
- රථවාහන නැවතුම් ගාස්තු, පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම
- කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු සඳහා සහන කාලයක් ලබා දීම (2021-09-30) දක්වා
- සියලුම දඩ මුදල් අය කිරීම (2021 මැයි සිට 2021 ජූනි මාසය දක්වා)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව සභාවේ සිදු වූ සාකච්ඡාවෙන් අනතුරුව,

- 2021 මැයි සිට 2021 ජූනි මාසය දක්වා කඩ කුලී හා වැසිකිළි ගාස්තුවලින් 50% බැගින් අය කිරීමත්,
- පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීමේ දී බස් ධාවනය යථා තත්ත්වයට පත්වන තුරු දෛනිකව ධාවනය වන බස් රථ ප්‍රමාණයෙන් 25% ක් අය කිරීම හා මැයි හා ජූනි මාස දෙකෙහි රථවාහන නැවතුම් ගාස්තුවලින් 50% බැගින් අය කිරීමත්,
- කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු ගෙවීම සඳහා 2021-09-30 දක්වා සහන කාලයක් ලබා දීමත්,
- 2021 මැයි සිට 2021 ජූනි මාස සඳහා පමණක් සියලුම දඩ මුදල් අය නොකිරීමත්

සුදුසු බවට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

මීට අමතරව පොදු වැසිකිළි ටෙන්ඩර්කරු විසින් 10 වෙනිදාට ගෙවිය යුතු මාසික කුලිය අදාල මාසයේම 25 වෙනිදාට ගෙවීමට සභා අනුමැතිය ලබා දෙන මෙන් ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා විසින් සිදු කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්. රුමී මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 බස් නැවතුම්පළ කඩ කාමරවල බදු අයිතිය සංශෝධනය කිරීම - (පළාත් පාලන කොමසාරිස්ගේ CLG/LG/5/2/1/2 හා 2021-05-21 දිනැති ලිපියට යටත්ව)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- බී 21 කඩ කාමරය - බාබා ලෙබ්බේ ඊබ්‍රාහිම් ලෙබ්බේ යන අය විසින් බුද්ධික ප්‍රදීප් ගුණසේකර යන අයට පැවරීම
- ඩී 1/1 කඩ කාමරය - ඩී. ඩී. එස් ද සිල්වා යන අය විසින් කවුඩන්ගල්ල ගමරාලලාගේ අජිත් අබේසුන්දර යන අයට පැවරීම
- ඩී 22 කඩ කාමරය - ඉන්දුක ලාල් ප්‍රසන්න සිල්වා යන අය විසින් ලක්ෂ්මන්

රංජාත් බෝපිටිය යන අයට පැවරීම

- ඩී 21 කඩ කාමරය - සම්පත් ශ්‍රී කරුණාරත්න යන අය විසින් සුබ්‍රමනියම් බාලසුන්දරම් යන අයට පැවරීම

- ඩී 11 කඩ කාමරය - උපුල් ප්‍රසන්න ගුණසේකර යන අය විසින් රුවන් චතුරංග අමරසිංහ යන අයට පැවරීම
- බී 13 කඩ කාමරය - අබුසාලි මෙහොම්මදු උවයිස් යන අය විසින් ජීවක කරුණාරත්න යන අයට පැවරීම
- සී 44 කඩ කාමරය - බානගල ගමරාළලාගේ රොෂාන් තුසිත යන අය විසින් ධනුෂ්ක කීර්ති අමරසිංහ යන අයට පැවරීම
- සී 48 හා සී 49 කඩ කාමරය-නාලක කටුපිටිය යන අය විසින් යූ. වී. දැල බණ්ඩාර යන අයට පැවරීම
- බී 18 කඩ කාමරය - එන්.එම්.එම්.සිද්දික් යන අය විසින් එම්.ඒ.එම්.ආමීර් යන අයට පැවරීම

- සී 34 කී මනි කඩ කාමරය - මනන්නලාගේ සුරේකා දමයන්ති යන අය විසින් ඉස්සරවේල් සිවකුමාර් යන අයට පැවරීම
- බී 01 කී මනි කඩ කාමරය - සිත්තරවේල් තුෂාන්දන් යන අය විසින් මොහොමඩ් උවයිස් මොහොමඩ් රුමී යන අයට පැවරීම
- ඩී 08 කී මනි කඩ කාමරය -අබුසාලි මෙහොම්මදු උවයිස් යන අය විසින් සෙල්වරත්නම් ධර්මරාජ් යන අයට පැවරීම
- ඒ 04 කී මනි කඩ කාමරය - එම්. එස්.එම්. අස්කර් යන අය විසින් එම්. අයි. මොහොමඩ් නවාස් යන අයට පැවරීම
- බී 03 කී මනි කඩ කාමරය - පටබැඳිගේ ඉසුරු ලක්මාල් කුරේ යන අය විසින් මර්සුක් ෆාහිමා යන අයට පැවරීම

- ඒ 20 කී මනි කඩ කාමරය - මහම්මදු ඉස්මායිල් හමීම් මහම්මදු යන අය විසින් කේ. කේ. වරුණ තිලංක යන අයට පැවරීම
- ඒ 14 කී මනි කඩ කාමරය - වයි.ඩබ්. ඇලිස් නෝනා යන අය විසින් ඩබ්. ඉඳුනිල් නිශාන් දේශප්‍රිය යන අයට පැවරීම
- අංක 08 මැණික් කඩ කාමරය - වඩුගේ වත්තේ ලූසියා යන අය විසින් ජී. අජිත් නයනප්‍රිය ඇල්බට් යන අයට පැවරීම
- අංක 07 පොළ කඩ කාමරය - ආර්. එම්. සුදුමැණිකේ යන අය විසින් ඒ. එච්.දිනූෂා ශිරෝමි යන අයට පැවරීම
- අංක 08 පොළ කඩ කාමරය - එල්. ජී. නන්දසේන යන අය විසින් පී. කේ. ජයරත්න යන අයට පැවරීම
- අංක 14 පොළ කඩ කාමරය - එච්. කේ. බේබි නෝනා යන අය විසින් ආර්. ඒ. වීරරත්න යන අයට පැවරීම
- අංක 183/05 පදික කඩ කාමරය- එස්. එම්. නිස්තාන් යන අය විසින් ඩබ්. එල්.එරංගනී විජේසේකර යන අයට පැවරීම
- අංක 185/21 පදික කඩ කාමරය- ඩබ්.එල්. එරංගනී විජේසේකර යන අය විසින් එස්. එම්. නිස්තාන් යන අයට පැවරීම
- අංක 04 සාප්පු කඩ කාමරය - ඒ. හුරුල් හිනායා යන අය විසින් ෆලීල් මොහොමඩ් රිෆායි යන අයට පැවරීම
- අංක 10 (කාර්පාර්ක්)කඩ කාමරය - ලිදමුලගේ වරුණ උමේධ සිල්වා යන අය විසින් සුපුන් ප්‍රසාද් මධුසංක යන අයට පැවරීම

- අංක 11 (කාර්පාර්ක්)කඩ කාමරය - විස්සහපුරගේ කලණසිරි යන අය විසින් එදිරිල්ලේ මුදියන්සේලාගේ ප්‍රභාත් හර්ෂණ යන අයට පැවරීම
- අංක 13 (කාර්පාර්ක්)කඩ කාමරය - මොහොමඩ් ෆලීල් මොහොමඩ් නවුෆර් යන අය විසින් මලීක්ෂා ෂබ්නම් ෂාබානු යන අයට පැවරීම

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:23 බළන්ගොඩ පොදු වෙළඳසැල අංක 16 දරණ ගවමස් කඩ කාමරය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ වර්ජනය හේතුවෙන් 2021-07-04 දින සිට වසා ඇති බව පවසමින් වැඩ වර්ජනය අවසන් වනතෙක් එම කාලයට අදාල කුලිය මාසික කුලියෙන් අඩු කරන ලෙස එම්. එම්. නජීම් යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ වැඩ වර්ජනය හේතුවෙන් වසා තැබූ දින 03 සඳහා පමණක් කුලිය මාසික කුලියෙන් අඩු කිරීම සුදුසු බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:24 බළන්ගොඩ නගර සභාවේ දැනට භාවිත කරන ක්ලවුඩ් සේවාව යාවත්කාලීන කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:25 2021 ජුලි මස කර්මාන්ත අංශයේ නඩත්තු සඳහා ද්‍රව්‍ය වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

| ද්‍රව්‍ය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|
| 1 1 /2 ගල් කියුබ් | 05 |
| චිප් ගල් කියුබ් | 05 |
| 3/4 ගල් කියුබ් | 06 |
| ABC කියුබ් | 07 |
| වැලි කියුබ් | 05 |
| තාර බැරල් | 30 |
| සිමෙන්ති බෑග් | 20 |

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය**

දිනකට සේවකයන් 15 බැගින් දින 25 කට කම්කරුවන් 375ක් අවශ්‍ය වේ.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන**

| | |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| D/D රෝල | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 50 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:26 කොම්පෝස්ට් පොහොර හැලීමෙන් පසු ඉතිරි වෙන කොටස් විශාල වශයෙන් ගොඩ ගැසී ඇති බැවින් භූමිය තුල ඉඩ සකසා ගැනීමටත්,එම කසල නැවත හලා පොහොර බවට පත් කර ගැනීමටත් අවශ්‍ය 120 එක්ස්කැවේටර් යන්ත්‍රයක් පැයකට රු. 3,350.00 ක අවම මිල ගණන ඉදිරිපත් කර ඇති ආසිරි කන්ස්ට්‍රක්සන් වෙතින් ලබා ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පැය 100 ක් සඳහා පැයකට රු. 3,350.00 බැගින් ආසිරි කන්ස්ට්‍රක්සන් වෙතින් 120 එක්ස්කැවේටර් යන්ත්‍රයක් ලබා ගැනීමට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:27 බැංකියවත්ත ප්ලාස්ටික්, පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ පොලිතින් කැපීමට අවශ්‍ය මැෂිම සඳහා අක්‍රිය වී ඇති මෝටරය වෙනුවට නව මෝටරයක් හා උපාංග මිල දී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:28 බළන්ගොඩ නගර මධ්‍යය තුල ඉදි කිරීම ආරම්භ කර ඇති ඇවිදින මංතීරු ව්‍යාපෘතියෙහි සංවර්ධන කාර්යයන් සිදු කිරීම සඳහා ආරක්ෂිත වැට සහ පස් ඉවත් කර දෙන මෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් කරන ලද ඉල්ලීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ඇවිදින මංතීරු ව්‍යාපෘතියෙහි සංවර්ධන කාර්යයන් සිදු කිරීම සඳහා ආරක්ෂිත වැට ඉවත් කිරීමට හැකි නමුත් පස් ඉවත් කර දීමට නොහැකි බව සභාවේ මතය විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:29 බළන්ගොඩ නගර මධ්‍යය තුල ඉදි කිරීම ආරම්භ කර ඇති ඇවිදින මංතීරු ව්‍යාපෘතියෙහි ඉතිරි කොටස සඳහා සැලසුම් පිළියෙල කිරීමට අවශ්‍ය මිනින්දෝරු සැලැස්මක් සකස් කර දෙන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් කරන ලද ඉල්ලීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ඇවිදින මංතීරු ව්‍යාපෘතියෙහි ඉතිරි කොටසෙහි සැලසුම් පිළියෙල කිරීමට අවශ්‍ය මිනින්දෝරු සැලැස්මක් සකස් කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් විමසා කඩිනමින් කටයුතු කළ යුතු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:30 රටේ පවතින අර්බුදකාරී තත්ත්වය යටතේ ඉදිරි මාස තුනක් සඳහාවත් මාසික කුලිය 50%ක සහනයක් ලබා දෙන ලෙස බළන්ගොඩ තානායම විසින් කරන ලද ඉල්ලීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව සභාවේ සිදු වූ සාකච්ඡාවෙන් අනතුරුව ඒ ඒ මාසයන් තුල රටේ ඇති වන තත්ත්වය මත ලබා දෙන සෞඛ්‍ය මාර්ගෝපදේශයන් සලකා බලා මාස තුනකට යටත්ව මසකට 50% බැගින් තානායම් කුලිය අඩු කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:31 වර්තමානයේ පවතින තත්ත්වය යටතේ බළන්ගොඩ විදු නැණ පියස මඟින් විද්‍යුත් ඉගැනුම් සඳහා එක් අයෙකුට දිනකට පැය 02 බැගින් නොමිලේ ලබා දීමටත්, වසර 13 ක් පැරණි පරිගණක 3ක් යාවත්කාලීන කිරීමට හා Headphone 08ක් ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:32 පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සංචාරක,ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය මඟින් පහත සඳහන් මාර්ග නඩත්තු වැඩසටහනට ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, අනුමත සමිතියක් මඟින් ඉටු කර ගැනීම (අනුඥාත නිවේදනය) සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- බළන්ගොඩ මහමෙව්නා මාවත වැවේගෙදර මාර්ගයේ සෝදා යන ස්ථානයේ පැති බැම්ම ඉදි කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාල ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතියට ලබා දීමට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:33 බළන්ගොඩ නගර සභා කාර්යාලයේ පිළිගැනීමේ කවුන්ටරයේ ඇති G16377 දරණ ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් Gestetner Of Ceylon PLC ආයතනයට රු.37,098.00 මුදල ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මිල ගණන් අනුමත කිරීම**

07:01:01 UQ 1933 යතුරු පැදිය අලුත්වැඩියා කිරීම සඳහා ඉන්දික මෝටර්ස් ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති රු. 19,368.00 ක ඇස්තමේන්තුව අනුමත කර අදාල සේවාව ලබා ගෙන මුදල් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:01:02 ZA 5039 (ෆෝටෝන්) ජේසී බී යන්ත්‍රය පූර්ණ සේවා කිරීම සඳහා නියෝජිත ආයතනය වන ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති රු. 44,615.09 ක ඇස්තමේන්තුව අනුමත කර අදාල සේවාව ලබා ගෙන මුදල් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:01:03 ZA 5039 (ෆෝටෝන්) ජේසීබී යන්ත්‍රයෙහි පහත අලුත්වැඩියා සඳහා නියෝජිත ආයතනය වන ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වෙතින් ඉදිරිපත් කර ඇති රු. 96,303.81 ක ඇස්තමේන්තුව අනුමත කර අදාල සේවාව ලබා ගෙන මුදල් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

- Solenoid,Fuel pump
- Bucket,Cylinder Seal kit
- 150A Realy (Stop solenoid relay) ආදි අමතර කොටස් යෙදීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කර්මාන්ත කමිටුව මඟින් නිර්දේශ කරන ලද යෝජනා**

**08:01 ජූලි මස කර්මාන්ත කමිටුව විසින් සිදු කිරීමට අපේක්ෂිත නඩත්තු**

08:01:01 වැවවත්ත ලැයිම් කාමර 10 කෝවිල පිටුපස කාණුව අලුත්වැඩියා කිරීම

08:01:02 ගරු රත්නපුර දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති අකිල එල්ලාවල මැතිතුමාගේ නිවසේ පාරේ කොලරය පුරවා නඩත්තු කිරීම

08:01:03 කරව්කැටිය 05 වන පටුමග මාර්ගය නඩත්තු කිරීම

08:01:04 දෙවට පාර දෙවන වර තාර දැමීම (ජූනි මස ඉතිරි වැඩ)

08:01:05 බෝම්බුව අමුණ පාර දෙවන වර තාර දැමීම (ජූනි මස ඉතිරි වැඩ)

08:01:06 අලාබ්දීන් මාවත පළමුවර හා දෙවන වර තාර දැමීම

08:01:07 මහමෙවුනා මාවත සිට වැවේ ළිඳ මාර්ගය නඩත්තු කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

08:02:01 පුවක්ගහමුල්ල පාර වැසිජල කාණු පද්ධතිය වසර 20 කින් පමණ අළුත්වැඩියාවක් කර නොමැති බැවින් එම කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම

08:02:02 වැවවත්ත කෝවිල පිටුපස පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:03 ගරු නාගරික මන්ත්‍රීනි එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය**

08:03:01 බළන්ගොඩ උඩ ඇල්ලෙපොල සරස්වතී පාරේ පිහිටි සුසාන භූමියෙහි ඉදිකරන ලද නව ගොඩනැගිල්ල සඳහා පිවිසෙන මාර්ගය ,මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉවත් කරන ලද ගල් උපයෝගී කරගෙන සෑදීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:04 ගරු නාගරික මන්ත්‍රිනි මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

08:04:01 ඇල්ලෙපොල කොට්ඨාශයේ පහළ ඇල්ලෙපොල ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගය දෙපස දැවී ගිය විදුලි පහන් නැවත ප්‍රතිස්ථාපනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි මංගලිකා ඉලංකෝන් මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:05 ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

08:05:01 කෝපිවත්ත මාර්ගයේ ගරාජය ඉහළ මාර්ගයේ මීටර් 30 ක් පමණ ප්‍රමාණයකට ඉන්ටර්ලොග් ගල් ඇතිරීම

ඉහත සඳහන් යෝජනාව නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:06 ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

08:06:01 කැළණි ඒජන්සිය ඉදිරිපිට වැසි ජලය ගලා බසින කාණුව වැසී ඇති හෙයින් එය නැවත සකස් කිරීම

08:06:02 කරව්කැටිය අබලන් පාලමේ වැට ඉදිකිරීම.

08:06:03 කරව්කැටිය උඩකන්ද පාර හා කාණු දෙපස සුද්ධ කිරීම.

08:06:04 උඩකන්ද පාරේ අතුරු මාර්ගයක් සඳහා (මීටර් 100ක් පමණ දුර) මහමෙව්නා මාවතෙන් ගලවා ඉවත් කරන ලද ඉන්ටර්ලොගින් ගල් ඇතිරීම.

08:06:05 කරව්කැටිය ප්‍රධාන පාර හා සියළුම අතුරු පාරවල් සුද්ධ කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:07 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

08:07:01 කොටුගොඩැල්ල පාරෙන් හැරෙන "කොටුව පාර" හංදියේ පාර මැදට වී ඇති පලකය පස්සට කොට හංදිය මට්ටම් කර වාහන හැරවීමට හැකි වන සේ නඩත්තු කරදීම.

08:07:02 කරව්කැටිය වටරවුම් පාරේ කාපට් දැමීමේ ක්‍රියාවලියේදී කහවන්දල මහතාගේ නිවසට ඇතුළු වන මාර්ගයෙන් කොටසක් මාර්ගයට කපාගත් අතර,එම නිවසට යාම සඳහා අඩි 03ක් උස දිග අඩි 32 ක් පමණ වන බැම් කැබැල්ලක් සාදා නඩත්තු කරදීම.

08:07:03 කරව්කැටිය වටරවුම් පාරේ "මහමෙව්නා" හංදියේ කැඩී ඇති කොන්ක්‍රීට් තහඩු දමා නඩත්තු කරදීම.

08:07:04 සෙලාන් බැංකුව ඉදිරිපිට"හිල් සයිඩ් පාරේ" නීතීඥ දේශබන්දු මහතා සහ නීතීඥ චන්ද්‍රසේකර මහතාගේ නිවෙස්වලට හැරෙන හංදියේ කොන්ක්‍රීට් ආවරණ 2 ක් දමා වාහන වැටෙන කපොල්ල වසා නඩත්තු කරදීම.

08:07:05 "සිරි වීරසුන්දරාරාම" හංදියේ පල්ලිය අසල වංගුවේ ඇති වාහන වැටෙන කපොල්ල වසා දැමීම.

08:07:06 නව බස්නැවතුම්පලේ කාර්මික අංශය අසල ඇති ගැටි දෙක බැකෝ යන්ත්‍රය මඟින් අයින් කර දුරගමන් සේවා බස්රථ සඳහා අවශ්‍ය ඉඩකඩ සලසා එම ස්ථානය නඩත්තු කරදීම.

08:07:07 කාර්පාර්ක් ඉදිරිපිට ජනතාව ගමන් ගන්නා බස් නැවතුම්පොළට හැරෙන හංදිය මට්ටම් කර නඩත්තු කරදීම.

08:07:08 "මැණික්" ව්‍යාපාරිකයන් ගැවසෙන තානායම් පිවිසුම් පාර හංදියේ එක් පැත්තක ඇත් වී ඇති කොන්ක්‍රීට් තහඩු ලංකර අඩු තහඩුව යෙදීම.

08:07:09 නව මහජන පොල සහ ක්‍රීඩාංගනය අතර වාහන නැවැත්වීමේ ස්ථානයේ ඇති වගුරුබිම සමතලා කොට ග්‍රෙවල් යොදා මට්ටම් කර වාහන නැවැත්වීම සඳහා සකස් කරදීම.

08:07:10 "කරව්කැටිය වටරවුම් පාරෙන්"හිල් සයිඩ් පාරට ඇති කෙටි මාර්ගය පයින් ගමන් කළ හැකි ආකාරයට ඇති ගැටි කඩා නඩත්තු කරදීම.

08:07:11 උඩකන්ද මාර්ගයේ දන්ත වෛද්‍ය කුලරත්න මහතාගේ නිවස ඉදිරිපිට ඇති අඩි 15ක් පමණ වූ කාණුව සකස් කිරීම.

08:07:12 උසාවියට නගින පඩිපෙල අසල ලොතරැයි කුඩුව ඉදිරිපිට කොන්ක්‍රීට් තහඩු යොදා ඇති බැම්ම කැඩී ඇති බැවින් එය පිළිසකර කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:08 ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා**

08:08:01 සඳුන්ගම මාර්ගය බොහෝ අබලන් වී ඇති බැවින් කොන්ක්‍රීට් පැච් යොදා නඩත්තු කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:09** වැලිහරනාව පරණ ජල ටැංකියට යන මාර්ගයේ ජල සම්පාදන නිල නිවාසවලට පහළින් ඇති ඉතා අවදානම් මාර්ගය පිළිසකර කිරීම ප්‍රදේශයේ ජනතාවගේ සහාය ඇතිව සිදුකිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. මන්ත්‍රී යෝජනා**

**09:01 ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

09:01:01 නගර සභා සීමාව තුල හිස් ඉඩම්වල ඩෙංගු අවදානම අවම කර ගැනීම සඳහා හිස් ඉඩම් හිමිකරුවන් දැනුවත් කර ශුද්ධ පවිත්‍ර කිරීමට අවශ්‍ය කටයුතු සලස්වා දෙන මෙන් ඉල්ලා සිටීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය, හිස් ඉඩම් කිහිපයක් පවතින බවත්, එම ඉඩම් හිමියන් දැනුවත් කර ශුද්ධ පවිත්‍ර කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් පැවසීය.

ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් පැවසූවේ අදාල ඉඩම් හිමියන් සම්බන්ධ තොරතුරු කඩිනමින් ලබා දෙන ලෙසත්, එසේ ලබා දීමෙන් පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

09:02:01 ඉරිදා සතිපොළ පවත්වන දිනයන් නිසියාකාරව ව්‍යාපාරිකයන්ට හා වෙළඳුන්ට දන්වන්න

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී වීරසිංහ මැතිතුමා, ඉරිදා සතිපොළ මාස ගණනක් තිස්සේ සෙනසුරාදා දිනයක තිබුණු අතර, වෙළෙන්ඳන් මේ සම්බන්ධ දැනුවත් නොවීම මත සෙනසුරාදා සහ ඉරිදා දින දෙකේම පොළ වෙත පැමිණෙන බවත්, මේ නිසා වෙළෙන්ඳන් මෙන්ම පාරිභෝගිකයන් අපහසුතාවයට පත්ව ඇති බැවින් නියමිත දවස තීරණය කර ඔවුන්ව දැනුවත් කරන ලෙසත් පැවසීය.

බළන්ගොඩ සතිපොළ ඉරිදා දිනයේ පැවැත්වීමට තීරණය කර ඇති අතර, ඔවුන්ව ඒ සම්බන්ධව දැනුවත් කරන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

09:02:02 කොරෝනා හේතුවෙන් මාස ගණන්, සති ගණන් සංචරණ සීමා නිසා වසා තිබූ බැවින් බළන්ගොඩ ඉරිදා සතිපොළෙන් වෙළඳාම් කළ අයගෙන් කඩ කුලිය අය නොකර සිටීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී වීරසිංහ මැතිතුමා පැවසූවේ කඩ කුලී අඩු කිරීම සම්බන්ධව මීට පෙර සිදු වූ සාකච්ඡාවේ දී මේ සඳහා පිළිතුරු ලැබුණු බවයි.

එමෙන්ම තමන් විසින් තව එක් කාරණයක් සම්බන්ධව අද දින සභාවට යෝජනාවක් ඉදිරිපත් කළ තිබූ නමුත් ඒ සඳහා ගරු සභාපතිතුමා ලිපියක් එවා තිබුණු අතර, තමන් එහි දී අදහස් කළ කාරණය පිළිබඳව කරුණු කීපයක් මෙහි දී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී වීරසිංහ මැතිතුමා පැවසීය.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින්, නගර සභා ආඥා පනත අනුව නගරය පාලනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කරන බව ද වෙළඳපොල සීමාව තුල මස්, මාළු හා එළවළු විකිණීමට අවසර ඇත්තේ පොදු වෙළඳසැලෙහි හෝ ගරු සභාපති විසින් බලය පවරන ස්ථානයක පමණක් වන නමුත් අද වන විට සෑම තැනම එළවළු කඩ පවතින බව ද මේ නිසා ව්‍යාපාරිකයන් දැඩි අපහසුතාවයකට පත්ව ඇති බව ද පෙර සඳහන් කළ කුකුල් මස් කඩය විවෘත කර තිබීම අතුරු ව්‍යවස්ථාවට පටහැනි බවද පැවසීය. එමෙන්ම නගර සභාවේ සියලුම දෙනාට එන්නත්කරණය සිදු කළ ද පෙර පාසල් පාලිකාවන්ට හා පුස්තකාල සම්බන්ධ කටයුතු කරන නිලධාරීන්ට මේ වන තෙක් එන්නත ලැබී නැති බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කර කඩිනමින් එන්නත්කරණය සිදු කිරීමට පියවර ගන්නා ලෙස ද පවසමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී වීරසිංහ මැතිතුමා තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් වෙළඳ ව්‍යාපාරිකයන් සහ ඔවුන්ගේ සහයකයන් සඳහා කඩිනමින් එන්නත්කරණය සිදු කරන ලෙස තමන් විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා වෙත යෝජනාවක් කළ බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසූවේ එම ව්‍යාපාරිකයන් සම්බන්ධ ලේඛන සකස් කිරීමට දින දෙකක් හෝ තුනක් ගත වන අතර, හැකි ඉක්මනින් එන්නත්කරණය සිදු කිරීමට කටයුතු කරන බවයි.

**09:03 ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

09:03:01 වත්මන් රජය ගෙන යන කාබනික පොහොර නිෂ්පාදනයට අප ආයතනය සම්බන්ධ වීමේ හා නිෂ්පාදනය වඩාත් ප්‍රතිඵලදායී වන ආකාරයට වැඩි දියුණු කිරීමට හා අවශ්‍ය අමතර කාබනික පොහොර නිෂ්පාදනයට යොදා ගන්නා නවීන තාක්ෂණය හා නවීන යන්ත්‍රෝපකරණ පිළිබඳ පුළුල් සාකච්ඡාවක් සඳහා යෝජනා කිරීම, වැඩසටහන් සැකසීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින්, සභාව ආරම්භයේ දී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ අදහසත් සමඟ තමන්ගේ අදහසත් ඉදිරිපත් වූ බැවින් සභාවේ දැනුවත්වීමක් සිදු වූ බව පැවසීය.

එමෙන්ම අනෙකුත් ආයතන හිතලවත් නැති කාලෙක කොම්පෝස්ට් නිෂ්පාදනය කළ ආයතනයක් ලෙස අප ඉදිරියෙන් සිටින බව ද නව අදහස්, යෝජනා, නව තාක්ෂණය හා නව උපකරණ මෙන්ම පොහොරවල තිබිය යුතු සංයුතිය සම්බන්ධව සාකච්ඡාවක් සිදු කිරීම තමන් මෙහි දී අපේක්ෂා කල බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා පොහොර ක්‍රියාවලියේ දී ප්‍රධාන වශයෙන්ම NPK බලපාන අතර, ක්‍රියාකාරිත්වය වැඩි කිරීමට බලපාන වෙනත් ද්‍රව්‍ය පිළිබඳව ද අවධානය යොමු කළ යුතු බව පැවසීය. මීට අමතරව අද වන විට ලෝකයේ කෙටි කාලීනව හා දීර්ඝකාලීනව ප්‍රයෝජනයට ගැනීමට හැකි දේ පැමිණ ඇති බවත්, ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයන් සිදු කර අනෙකුත් ආයතනයන් අභිබවා මීට පෙර අප ආයතනය ඉදිරියෙන් සිටි ආකාරයෙන්ම වර්තමානයේ ද සිටීමට කටයුතු කළ යුතු බවත්, පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා පැවසුවේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය යනු අපේ හදවත බවයි. එමෙන්ම පක්ෂ භේදයකින් තොරව එය ආරක්ෂා කර ගනිමින් වැඩි දියුණු කර පවත්වා ගෙන යා යුතු බව ද ඒ සම්බන්ධව සාකච්ඡා කිරීම මෙහි දී තමන් අපේක්ෂා කළ අතර, අද දින වෙන දිනයන්ට වඩා මේ පිළිබඳව සියලු මන්ත්‍රීවරුන් දැනුවත් වූ බව ද පවසන ලදී.

09:03:02 ස්මාට් දුරකතනයක් ඉල්ලා ආර්. එම්. යතුසා ජයනි විජේරත්න දරුවාගේ ලිපිය ගරු සභාවට ඉදිරිපත් කිරීම හා යෝජනාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා පැවසුවේ මෙම දරුවා සඳුන්ගම ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුලක දරුවෙක් බවත්, ඇයගේ මව මානසික ආබාධයකින් පෙළෙන බවත් ය. එමෙන්ම මෙම පවුල ලේකම්තුමිය, වැඩ අධිකාරීතුමා හා මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා පරීක්ෂා කර බැලූ, වැසිකිළි නොමැති පවුල් සඳහා නගර සභාව විසින් ලබා දෙන වැසිකිළි ආධාර රු.50,000.00 හිමි වූ පවුලක් බව ද පැවසීය. එම නිසා මෙම දරුවාගේ ඉල්ලීම සලකා බලා ඔන්ලයින් අධ්‍යාපනය සම්බන්ධව ගැටලුවක් පවතින මෙම අවස්ථාවේ මෙම දරුවාට උදව් කිරීමට හැකියාවක් පවතී නම් ස්තුතිවන්ත වන බව ද වැඩිදුරටත් පවසන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, ගරු සභාවේ අනුමත කර, මෙම ස්මාට් දුරකතනය සභාවෙන් ලබා දීමට හැකියාවක් පවතී ද යන්න පිළිබඳ නීත්‍යානුකූල තත්ත්වය බැලීමෙන් අනතුරුව ලබා දීමට හැකි නම් එහි ගැටලුවක් නොමැති බව ද එසේ නොමැති නම් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට සිදු වන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ මෙය අධිභාරයක් විය හැකි දෙයක් නොවන අතර, දරුවාගේ අවශ්‍යතාවය පවතින අවස්ථාවක ලබා නොදී පසුව ලබා දී වැඩක් නොමැති බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09:04 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

09:04:01 විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා දීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ දීර්ඝකාලයක් තිස්සේ දරුවන්ට ලබා දුන් විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව මෙම වසරේ ද ලබා දීමට කටයුතු කරන ලෙසයි. එමෙන්ම පසුගිය වසරේ සිට මෙම ශිෂ්‍යත්ව ලබා දුන්නේ අඩු ආදායම්ලාභී පවුල්වලට පමණක් වීම නිසා අසාධාරණයක් සිදු වූ බවද මෙය ලබා දිය යුත්තේ දරුවන්ගේ දක්ෂතාවය ඇගයීම සඳහා බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ඉදිරියට ශිෂ්‍යත්ව ලබා දීමේ දී විශ්ව විද්‍යාලයට තේරී පත්වන සියලුම දරුවන්ට ලබා දීමට කටයුතු කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09:05 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

09:05:01 දැනට අලුතින් ඉදිවෙමින් පවතින ඇවිදීමේ මංතීරුව සමඟ නව බස්නැවතුම්පළේ සිට මහජන පොළ දක්වා විකල්ප මාර්ගයක් සෑදීමට ඉඩ ඇති හෙයින් ඉදිවන ඇවිදීමේ මංතීරුව සමඟම අයින් කරන පස් මට්ටම් කර මාර්ගය ස්ථාපනය කිරීම

09:05:02 නගරයේ අත්‍යවශ්‍යම ස්ථානවලට අවශ්‍ය විදුලි බුබුළු අඩුපාඩු දමන ලෙස ඉල්ලීම

09:05:03 ඉහත දී ඉල්ලීම් කරන ලද නගරයේ පදික වේදිකාවේ කැඩුණු කොන්ක්‍රීට් තහඩු සැකසීමට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ලිපි ලිවීම

09:05:04 ගරු උප සභාපතිතුමාගේ සහ මලීක්ෂා මන්ත්‍රීතුමාගේ අවසරය ඇතිව දෙහිගස්තලාව ජෙයිලානි ජාතික පාසලේ තොරණ ඉදිරිපිට නිවෙස්වලින් පිටවන අප ජලය සහ වැසි ජලය ගලා යාමට කාණුවක් නිර්මාණය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම

09:05:05 ගරු විපක්ෂ නායකතුමා වන වසන්ත මන්ත්‍රීතුමාගේ අවසරය ඇතිව තුඹගොඩ හංදියේ යකඩ වැට පස්සට කොට වංගුව හැකි තරම් විශාල කිරීම. මෙය මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුතුමා නිරීක්ෂණය කර ඇත.

09:05:06 දොරවෙල පාලම සිට සිගිති උයන දක්වා දිවෙන කොන්ක්‍රීට් මාර්ගය වාහන ගමන් කළ හැකි අයුරින් වෙළඳසැල් හිමියන් දැනුවත් කර ඉඩ සලසා දීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, අලුතින් ඉදිවන ඇවිදින මංතීරුව සමඟ විකල්ප මාර්ගයක් සෑදීමට ඉඩකඩක් පවතින හෙයින් ඒ සඳහා මංතීරුව සකස් කිරීමේ දී ඉවතලන පස් වෙනත් ස්ථානයකට ගෙනයාමට පෙර මෙම ඉඩෙහි මට්ටම් කර

මාර්ගය ස්ථාපනය කරන ලෙස ද අවශ්‍ය ස්ථානවලට බල්බ් යොදන ලෙස ද පදික වේදිකාවේ කැඩුණු කොන්ක්‍රීට් තහඩු සැකසීම සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කළ නමුත් ඒ සම්බන්ධ සැලකිල්ලක් නොදක්වන නිසා නැවත දැනුවත් කිරීමට ද කැඩුණු කොන්ක්‍රීට් තහඩු තව කිහිපයක් පවතින අතර, මේ නිසා නගරය අවලස්සන වී ඇති බව ද පැවසීය.

එමෙන්ම 09:05:04 යෝජනාව සම්බන්ධයෙන් ගරු උප සභාපති එම්. ටී.එම් රූමි මැතිතුමා අදහස් දක්වමින් පැවසුවේ ජස්ටින් මහතාගේ නිවස අසලට එනතෙක් කාණුව කපල තිබෙන අතර, ජේසීබී යන්ත්‍රය කැඩී ඇති බැවින් එය යථා තත්ත්වයට පත් වූ විගස ඉතිරි කොටසෙහි කාණුව සකස් කරන බවයි.

09:05:06 යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, මෙම මාර්ගය කොන්ක්‍රීට් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සකස් කළ නමුත් මේ වන විට මාර්ගය වැසෙන ආකාරයට වෙළඳසැල් හිමියන් වහලවල් ගසා ඇති බැවින් හැකි ඉක්මනින් ඔවුන්ව දැනුවත් කර මාර්ගය වාහන ගමන් කළ හැකි අයුරින් ඉඩ සලසා ගැනීමට කටයුතු කළ යුතු බව පවසන ලදී.

මීට අමතරව තවත් යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීමට ඇති බවත්, ඉන් පළමු වැන්න වන්නේ හදිසි අවශ්‍යතා සඳහා ජල කරාම කිහිපයක් ස්ථාපනය කිරීම වන අතර, මේ පිළිබඳව ජල සම්පාදන මණ්ඩලය වෙත ඉල්ලීමක් කර ඇති බවද නගරයේ හදිසි ගින්නක් ඇති වුවහොත් ජලය නොමැති වීමේ ගැටලුවට විසඳුමක් මෙය ඉටු කර ගැනීම තුලින් ලබා ගත හැකි බවද පැවසීය. එමෙන්ම බස් නැවතුම්පළ පදික කඩ සඳහා විදුලිය ලබා දෙන ලෙස තමන් පැවසූ බවට සභාවේ ගත් තීරණවල සටහන්ව ඇති නමුත් තමන් එහි දී එවැනි දෙයක් අදහස් කළේ නැති බව ද අප සතු ගොඩනැගිල්ලෙන් ස්ථාපනය කළ ස්ථානවල විදුලි බල්බ් 04 ක් අක්‍රිය වී ඇති බැවින් ඒවා සකස් කර දෙන ලෙස එහිදී පැවසූ බවත් සඳහන් කරන ලදී.

තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසුවේ බළන්ගොඩ මහජන බැංකුවට යාබද දෙවට පාර වාහන නිසා අවහිර වී ඇති බැවින් එම මාර්ගයේ ගමන් කරන ජනතාව අසීරු තත්ත්වයට පත්ව ඇති බවත්, ඒ සඳහා පුවරු කිහිපයක් හෝ ස්ථාපනය කර මෙය වළක්වා ගැනීමට පියවර ගත යුතු බවයි.

එමෙන්ම සේනක පෙදෙසේ මාර්ගය මැද පවතින ගස් දෙක ඉවත් කිරීමට මාස දෙක තුනකට පෙර ඉල්ලීමක් කළ ද තවමත් ඉටු වී නැති බැවින් නගර සභාව මගින් එම ගස් ඉවත් කර දෙන ලෙසත්, බළන්ගොඩ කඩ පේළියේ රොෂාන් යන අය විසින් අක්‍රිය වී ඇති විදුලි පහනක් ගැන තමන්ට පැවසූ අතර, එය සකස් කර දෙන ලෙසත්, උඩ ඇල්ලෙපොල, අංක 390/01 ලිපිනයේ පදිංචි කේ. මල්ලිකාරත්න යන අය විසින් නාය යෑමට ලක්ව ඇති මාර්ගයක් පිළිබඳව සඳහන් කර ලිපියක් මා වෙත ලබා දුන් අතර, ඒ සම්බන්ධව ඔහු යම් උපදෙසක් බලාපොරොත්තු වන බැවින් පැමිණ සාකච්ඡා කර ගන්නා ලෙසට දැනුම් දන බවත් පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09:06 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

09:06:01 බුලත්ගම තලාවගෙදර පාර යෝජිත ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග උරහිස පළුදු කිරීමේ ගාස්තුවෙන් නිදහස් කිරීම සහ ජල නල එළීමට කාණු කැපීම සඳහා ජේසීබී යන්ත්‍රය ලබා දීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**11. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 1,201,904.32 |
| වෙනත් ලැබීම් | 5,673,513.22 |
| මුලු ලැබීම් | 6,875,417.54 |
| පුනරාවර්තන වියදම් | 9,286,450.00 |
| වෙනත් වියදම් | 1,521,058.10 |
| මුලු වියදම් | 10,807,508.10 |

2021-06-01 දින සිට 2021-06-30 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 4,160.00 |
| | 16,428.00 |
| 227-5020 | 11,918.00 |
| | 19,203.00 |
| RD - 8240 | 10,868.00 |
| | 9,934.50 |
| RE2600 | 11,265.00 |
| BC-0005 | 20,800.00 |
| | 11,100.00 |
| QL2901 | 1,256.00 |
| 226-7521 | 6,240.00 |
| | 6,660.00 |
| LL - 7688 | 3,640.00 |
| RB4786 | 8,236.80 |
| | 10,434.00 |
| JD 4684 | 1,370.00 |
| | 1,570.00 |
| GC0001 | 2,603.00 |
| | 5,495.00 |
| RC1107 | 14,220.00 |
| | 18,999.87 |
| RC8183 | 4,472.00 |
| | 9,102.00 |
| ND5124 | 5,720.00 |
| | 18,870.00 |
| PF-4006 | 14,520.00 |
| | 17,136.00 |
| RD 8000 | 5,824.00 |
| | 6,660.00 |
| LL-2110 | 20,837.00 |
| RC 1118 | 9,672.00 |
| SDRR0013 | 2,220.00 |
| UQ - 1933 | 1,370.00 |
| ZA 5039 | 26,970.00 |
| | 50,727.00 |
| **එකතුව** | **390,501.17** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**12. ඇස්තමේන්තු අනුමත කිරීම**

**12:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

12:01:01 බැංකියවත්ත හට් එක සකස් කිරීම සඳහා වන ඇස්තමේන්තුව - රු. 610,522.00

12:01:02 කොටුගොඩැල්ල මාර්ගයේ කහඳවල මහතාගේ නිවස ඉදිරිපිට පැති බැම්ම ඉදි කිරීම සඳහා වන ඇස්තමේන්තුව - රු. 180,250.00

12:01:03 ඕලුගංතොට රයිවත්ත මාර්ගයේ නඩත්තු කටයුතු සඳහා වන ඇස්තමේන්තුව රු. 205,000.00

12:01:04 බෝම්බුව පහළ මස්සැන්න මාර්ගයේ නඩත්තු කටයුතු සඳහා වන ඇස්තමේන්තුව රු. 200,211.79

12:01:05 මිරිස්වත්ත අලබ්දීන් මාවත නඩත්තු කටයුතු සඳහා වන ඇස්තමේන්තුව - රු. 200,211.79

12:01:06 දෙවට පාර නඩත්තු කටයුතු සඳහා වන ඇස්තමේන්තුව - රු. 43,028.84

12:01:07 බෝම්බුව අමුණ පාර නඩත්තු කටයුතු සඳහා වන ඇස්තමේන්තුව - රු. 390,065.08

12:01:08 මැද කිරිදිගල පළමු පටුමග නඩත්තු කටයුතු සඳහා වන ඇස්තමේන්තුව - රු. 166,193.71

12:01:09 පිරිවෙන කුමාරගම අතුරු මාර්ගයේ සුගතදාස මහතාගේ නිවස මාර්ගය නඩත්තු කටයුතු සඳහා වන ඇස්තමේන්තුව - රු. 151,793.90

12:01:10 සියඹලාගහවත්ත මාර්ගයේ කැඩී ඇති ස්ථාන සඳහා ආරක්ෂාවට ඇති පැති බැම්ම ඉදි කිරීම සඳහා වන ඇස්තමේන්තුව - රු. 272,709.54

12:01:11 උඩ ඇල්ලෙපොල වැවේ ළිඳ මාර්ගයේ ආරක්ෂාවට පැති බැම්ම ඉදි කිරීම සඳහා වන ඇස්තමේන්තුව - රු. 1,089,758.12

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත 12:01:01 සිට 12:01:10 දක්වා වූ ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත වූ අතර, 12:01:11 ඇස්තමේන්තුව නඩත්තු යටතේ ඉටු කිරීමට නොහැකි සංවර්ධන කටයුත්තක් බැවින් සභාවේ අනුමත නොවීය.

**13. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් පොදු ජන එක්සත් පෙරමුණේ නිර්මාතෘ බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමා ගරු මුදල් අමාත්‍යවරයා වශයෙන් පාර්ලිමේන්තුවට පැමිණීම පිළිබඳව තමන්ගේ සතුට පිරි සුභාශිංසනය පිරිනමන බවද කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ රට පුරා සාර්ථකව එන්නත්කරණය සිදු වන බව දකින්නට ලැබෙන අතර, ඉන්දුනීසියාව හා ඉන්දියාව ඇතුළු රටවල් සන්සන්දනය කිරීමේ දී දකුණු ආසියාවේ හොඳම එන්නත්කරණ වැඩසටහන අපේ රටේ සිදු වන බව පෙනී යන බවත් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් පසුගිය කාලයේ රුපියල් 50,000.00 බැගින් වැසිකිළි ආධාර ලබා දුන් පරිදි එම වැඩසටහන මෙම වසරේ දී ද කළ හැකිදැයි විමසීය. එමෙන්ම ගල්වල පාර හා උඩකන්ද පාරෙහි විදුලි බල්බ යොදන ලෙසද තුඹගොඩ බස්නැවතුම්පළ ඉදි කරන බව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූ නමුත් අද වනතුරු එය සිදු වී නැති අතර, පක්ෂ භේදයක් නැතිව මිනිස්සු වෙනුවෙන් මෙය ඉටු කරන ලෙස තමන් ඉල්ලා සිටින බව ද උඩකන්ද පාර කාපට් කරන බව එතුමා පැවසුව නමුත් එය ද ඉටු වී නැති බැවින් කොන්ක්‍රීට් හෝ යොදා පාර සකස් කර දෙන ලෙසද විශේෂයෙන් තම පක්ෂයේ අය පවා බළන්ගොඩට කෙනෙක් අවශ්‍ය යැයි පවසා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාට ඡන්දය ලබා දුන් අතර, එතුමා හරහා හෝ මෙම පාර සකස් කර දෙන ලෙස ද පවසන ලදී.

එමෙන්ම තමන් විසින් නිතරම ඉල්ලා සිටි කාණුවේ වැඩ කටයුතු අවසන් වී ඇති බැවින් ඒ සම්බන්ධව කර්මාන්ත කමිටුවේ ගරු සභාපතිතුමා වෙත ස්තුතිය පළ කරන බව ද කරච්කැටියේ සිට පැමිණෙද්දී උඩකන්ද පාරේ කොටසක කාණුවක් තිබුණු බවත්, අප ඒ සඳහා අකමැති වූ බවත් පවසා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා දොස් නැගූ බව ද ගමේ වැඩක් කිරීමේ දී පක්ෂ පාට භේදයක් නොමැති අතර, එම ස්ථානයේ කාණුවක් නොතිබුණු බව වැඩ කරන අය පවා තමන්ට පැවසූ බව ද කෙසේ නමුත් අපගේ කොට්ඨාසවල සංවර්ධන කටයුතු කිරීම සම්බන්ධයෙන් සතුට පළ කරන බව ද පැවසීය.

මීට අමතරව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පසුගිය සභාවේ සිදු කළ කතාවේ දී රාජ්‍ය සේවකයෝ සත පහක වැඩක් නැතිව නිවසේ සිට පඩි ගන්නා බව පැවසීම අසාධාරණ අතර, නගර සභාවේ ලේකම්තුමිය ඇතුළු බොහෝ නිලධාරීන් කාර්යාලයේ කටයුතු සිදු කළ බව ද මධ්‍යස්ථව බලන ලෙස ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් තමන් රාජ්‍ය සේවකයෙක් බව ද පසුගිය සභාවේ සිදු කල කතාවේ දී සක්‍රීය රාජ්‍ය සේවයේ නියුතු රාජ්‍ය සේවකයන් ගැන නොපැවසුව බව ද බොහෝ දෙනා එම කතාවට වැරදි අර්ථකතනයක් ලබා දී මිනිසුන් නොමඟ යැවීමට උත්සාහ කළ අතර තමන් රාජ්‍ය සේවකයන්ට අගෞරව කළා යැයි පවසා උද්ඝෝෂණ පවා ඇති කිරීමට කටයුතු කළ බව තමන් දන්නා බව ද එම සියලුම සැලසුම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව ද පැවසීය. කෙසේ නමුත් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය මේ සම්බන්ධයෙන් මතක් කළ නිසා නිවැරදි කිරීමක් මෙහි දී සිදු කරන බව ද තමන් විසින් සිදු කළ කතාවේ දී රාජ්‍ය සේවකයන් නිවසේ සිට පඩි ගන්නවා යැයි නොපැවසුව අතර, රාජ්‍ය සේවකයෝ ලක්ෂ 15 ක් තමන්ගේ සේවය රජයට සපයන්නේ නැතිව නිවසේ සිට පඩි ගන්නා බවට වැරදි අර්ථකතනයක් මෙහිදී ගෙන ආ බව ද පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් තමන් මාර්ග සංවර්ධන අධිකාරිය සම්බන්ධ කරගෙන පෙට්ටිගල පාර කාණු සුද්ධ කර දෙන ලෙස නිතර නිතර පැවසූ නමුත් ඔවුන් එය නොකළ බැවින් නගර සභාව විසින් එම කටයුත්ත ඉටු කිරීම පිළිබඳව ස්තුතිය පළ කරන ලදී. එමෙන්ම ආචාරිමලේ පාර තාර දමා සංවර්ධනය කිරීම හා ඒ සමගම පැති බැමි සකස් කිරීම කර ඇති බවද හිටපු සභාපතිතුමාගේ මුල්ම නිවස ඉදිරිපිට බැම්මක් ඉදි කර තිබෙන නිසා මාර්ගය පුළුල් වී ඇති නමුත් එම ස්ථානයේ පවතින විදුලි කණු දෙක හේතුවෙන් මාර්ගයේ ප්‍රයෝජනය ගැනීමට නොහැකි වී ඇති බව ද මේ නිසා එම විදුලි කණු දෙක ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ද පරගහකුඹුර පාර ගමන් කළ නොහැකි මට්ටමට පත්ව ඇති නිසා එය සකස් කර දෙන ලෙස ද පැවසීය.

එමෙන්ම නගර සභා සීමාව පුළුල් වීමෙන් පසුව උඩකන්ද පාර එළිපෙහෙළි වීමක් වූවා නම් එය සිදු වුනේ පසුගිය දිනක වීම නිසා මිනිසුන්ගේ ප්‍රශංසාව නගර සභාවට හිමි වූ බව ද ඒ සම්බන්ධව විශේෂ ස්තුතිය පිරිනමන බව ද පරගහකුඹුර පිවිසුම් ස්ථානය කඩිනමින් කර දෙන ලෙස ද පවසමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් දෙල්ගස්වත්ත මාර්ගයේ පවතින ප්‍රජාශාලාව දරුවෙක් කිරා ගැනීමටවත් නොහැකි තත්ත්වයට පත්ව ඇති බව පවුල් සෞඛ්‍ය නිලධාරීතුමිය තමන් හට පැවසූ බව ද සම්පූර්ණම අලුත්වැඩියාවක් නොවුනත් ප්‍රතිසංස්කරණ කටයුතුවල දී ඒ සඳහා යම් කිසි සහයෝගයක් ලබා දෙන ලෙස ද පැවසීය.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සිදු කළ කතාව සම්බන්ධව තමන් මෙහි දී අදහස් දක්වන්නට බලාපොරොත්තු වන බව ද එතුමා රජයේ නිලධාරියෙක් වශයෙන් රජයේ නිලධාරීන්ට විරුද්ධව කවදාවත් කතා නොකරන අතර, එතුමා සිදු කල කතාව වැරදි ආකාරයෙන් තේරුම් ගැනීමක් එහි දී සිදුවීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන බව ද පැවසීය.

මේ සම්බන්ධව වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය පැවසුවේ මාධ්‍යවලින් පවා නිවැරදි දේ වැරදි ලෙස ප්‍රචාරය කිරීමට දක්ෂ අතර, පසුගිය දිනක රුපියල් 5000.00 දීමනාව ලබා දීමේ අවස්ථාවක සිදු වූ සිදුවීමක් වැරදි ලෙස මාධ්‍ය තුලින් ප්‍රචාරය වූ බවයි. එමෙන්ම රුපියල් 5000.00 ලබා දීමේ දී රැකියා ලැබූ අඩු ආදායම්ලාභීන්ට පවා එම මුදල් ලබා දුන් බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ මැදිහත්වීමෙන් බළන්ගොඩ නගරයේ විශාල සංවර්ධනයක් සිදුවෙන අතර, විශේෂයෙන් බළන්ගොඩ ක්‍රීඩාංගනය සංවර්ධනයට ලක්ෂ 50 ක මුදලක් ලැබී ඇති බැවින් එහි අවශ්‍ය මූලික කටයුතු ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ මූලිකත්වයෙන් සිදුවෙන බවත්, ඇවිදින මංතීරු ව්‍යාපෘතියෙහි අවශ්‍ය කටයුතු ගරු සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය විසින් සිදු කරමින් පවතින බවත්, තවත් එක් අඩුපාඩුවක් පවතින බැවින් එය සකස් කර දෙන ලෙසත්

පැවසීය. එනම්, නගරයේ අප ජලය ගලා යන කාණු පද්ධතියේ අප ජලය කෙලින්ම දොරවෙල ඔයට පැමිණෙන අතර, දොරවෙල ඔයෙහි ජලය ප්‍රයෝජනයට ගන්නා විශාල පිරිසක් සිටින බැවින් ජලය පිරිසිදු කර ගැනීම සඳහාත් ගංවතුර උවදුර වැළැක්වීම සඳහාත් අප ජලය ගලා යන කාණු පද්ධතියට ෆිල්ටර් පද්ධතියක් අවශ්‍ය බවයි. මේ සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමාට පවසන ලෙසත්, එහි දී අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කළ හැකි බව ගරු සංවිධායකතුමා තමන් හට පැවසූ බවත් වැඩිදුරටත් පවසන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු සභාපතිතුමා, මෙම ව්‍යාපෘතිය මීට පෙර අවස්ථාවක දී අනුමත කර මුදල් ලබා දීමට පවා සූදානම්ව තිබුණු නමුත් කුමන හෝ දේශපාලන ප්‍රශ්නයක් මත එය නතර වූ බව ද මෙය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණයට ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශයෙන් තමන්ට පැවසූ බව ද පැවසීය.

නැවතත් ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් කොමර්ෂල් බැංකුව, ලංකා බැංකුව හා මහජන පොළෙහි විදුලි පහන් අක්‍රිය වී ඇති බව ද ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කළ සඳුන්ගම මාර්ගය කොන්ක්‍රීට් යොදා නඩත්තු කිරීම කඩිනමින් කර දෙන ලෙස ද ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය නිතරම ඉල්ලා සිටි උඩකන්ද පාර අත්වැට සඳහා ඇස්තමේන්තු සකස් කර හැකි ඉක්මනින් එය ඉටු කර දෙන ලෙස ද පවසා තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් ශෛලතලාරාම පන්සල පාරෙහි සංවර්ධන කටයුතු ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් සිදු කරගෙන යාම පිළිබඳ එතුමාට ස්තූතිවන්ත වන බව ද තමන්ගේ නිවසට ඉහළින් ඇති පාරේ අඩි 12 ක ප්‍රමාණයේ කාපට් කිරීමක් අනුමත වී තිබෙන බැවින් එම ප්‍රමාණයෙන් එය සිදු කරන ලෙස ද ඇතැම් ස්ථානවල අඩි 08ක් පවතින බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ද පැවසූ අතර, වැඩකටයුතු සාර්ථකව කර ගැනීමට එතුමාට ශක්තිය ධෛර්යය ලැබේවා යි තමන් ප්‍රාර්ථනා කරන බව ද පැවසීය. එමෙන්ම දඹගහ නිවස ළග අඹගහ තවමත් කපා නැති බැවින් කඩිනමින් එය ඉටු කර

දෙන ලෙසත්, පෙබරවාරි මාසයේ යෝජනාවල කොන්ක්‍රීට් කරන බව පැවසූ ස්ථාන තවම සිදු කර නොමැති බැවින් ඒ කටයුතු ඉටු කර දෙන ලෙසත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනි එම්. ශාන්තිලේඛා මහත්මිය**

ගරු නාගරික මන්ත්‍රීනි එම්. ශාන්තිලේඛා මහත්මිය අදහස් දක්වමින් මහමෙව්නා පාරේ එක කොටසක් කාපට් ව්‍යාපෘතියක් මගින් සංවර්ධනය වූ නමුත් එහි තවත් කොටසක ගමන් කිරීමට නොහැකි තත්ත්වයෙන් විශාල වලවල් පවතින බව ද අබලන් කාණු පද්ධතියක් පවතින බව ද කාපට් ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රමාද වනවා නම් එම වලවල් හෝ පුරවා පාර සකස් කර දෙන ලෙස ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් අපි හිනාවෙලා සාමාන්‍ය විදිහට තීන්දු තීරණ ගත්තත් එම තීරණ ඉතා වගකීමෙන් ගන්නා බව ද ඇතැම් අවස්ථාවල පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අප වෙත ලබා දී තිබෙන චක්‍රලේඛ උපදෙස් පවා අභිබවා තීන්දු තීරණ ගන්නා අවස්ථා පවතින බව ද විශේෂයෙන් මාළු කඩ සම්බන්ධව තීරණ ගැනීමේ දී අප එය සභාවේ හැල්ලුවට නොගෙන කවුරුත් අපහසුතාවයට පත් නොවී සභාවක් විදිහට පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් සියලු දෙනාම බළන්ගොඩ ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් කටයුතු කළ බව ද සභාවක විය යුත්තේ එය බව ද ඒ සම්බන්ධව තමන් සතුටට පත්වන බව ද පැවසීය. එමෙන්ම සභාවක් ලෙස අප වැරදි තීන්දුවක් නොගත්තේ නම් එම තීන්දුව අභියෝගයට සභාවක ලක් කරන්න හැකි නම් සභාවේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාට එම ගෞරවය හිමි විය යුතු බව ද එබැවින් තීරණ ගත යුතු නිසි වේලාවේ එම තීරණ ගත යුතු බව ද ගරු මන්ත්‍රීවරුන්ට විවිධ අදහස් හා යෝජනා තිබුණත් සභාවක් ලෙස කොන්ද පණ තියෙන තීන්දු ගැනීමට හැකි විය යුතු බව ද වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම මන්ත්‍රී යෝජනාවල දී තමන් විසින් ඉදිරිපත් කළ ස්මාට් දුරකතනයක් ලබා ගැනීම සම්බන්ධව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා පැවසුවේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සම්බන්ධව අප වෙත එවා ඇති උපදෙස් මත එම දුරකතනය ගැනීමට නොහැකි වුව ද අපි කළ යුතු දේ සද්භාවයෙන් කරන්නේ නම් එය අභියෝගයකට ලක් නොවන කාරණයක් බව තමන් හිතන බවයි. විශේෂයෙන් එම දරුවා මේ පිළිබඳව දැඩි බලාපොරොත්තුවෙන් සිටින බැවින් මේ සම්බන්ධව තීන්දුවක් ගන්නා ලෙස තමන් නැවතත් මෙම සභාවට යෝජනා කරන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මහත්මිය ශ්‍රී ලංකාවේ එන්නත්කරණය පිළිබඳව සතුටින් කතා කළා සේම සාර්ථකව එන්නත්කරණය සිදු කරන රටක් වශයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රශංසාවක් ශ්‍රී ලංකාව වෙත ලබා දී තිබුණු බව අද උදේ ප්‍රවෘත්ති ප්‍රකාශය හා පත්තරවල සඳහන් වූ බව ප්‍රකාශ කළ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා ලෝකයේ බොහෝ රටවල්වල සමූහ මිනීවලවල් දක්නට ලැබුණ ද ලංකාවේ එහෙම තත්ත්වයක් නොමැති බව ද ඇතැම් බංකොලොත් දේශපාලකයන් එවැනි තත්ත්වයක් රට තුළ ඇති බවට උලුප්පා පෙන්වීමට උත්සාහ කල නමුත් වත්මන් ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ එවැනි තත්ත්වයක් ඇති වීමට ඉඩ තබා නොමැති බව ද ජනතාව කවදා හෝ මෙම සත්‍ය තේරුම් ගන්නා බව තමන් විශ්වාස කරන බව ද පැවසීය. එමෙන්ම ශ්‍රී ලංකාවේ එන්නත්කරණය ගැන කතා කිරීමේ දී සෑම පුද්ගලයන් 10,000 කින් 67 දෙනෙකුටම එන්නත් ලබා දී ඇති බව ද ඉන්දියාවේ මෙය 45 ක් වන අතර ලෝක මට්ටමින් එය 39 ක් වන නමුත් ඇතැම් යුරෝපයේ රටවල්වල මෙය 70 ක් වන බව ද ඒ කෙසේ නමුත් අපේ රට වෙනත් රටකින් වැක්සින් ආනයනය කර එන්නත්කරණය සාර්ථකව සිදු කිරීම සම්බන්ධයෙන් තමන් රජයට ප්‍රශංසාව පිරිනමන බව ද පවසන ලදී.

එමෙන්ම රජය මේ වෙලාවේ විශාල අපහසුතාවයන් දෙකකට ලක් වී ඇති අතර, එනම් කොරෝන වසංගතයෙන් පෙන්වීමට උත්සාහ කරන බොරු බියට මුහුණ දීමත්, පොහොර සම්බන්ධයෙන් ගැටලුවකට මුහුණ දීමත් ය. එහි දී සැලසුම්සහගත නොවීම පිළිබඳ යම් ගැටලුවක් තිබුණ ද ඒවා ජයගෙන මේ රට සෞභාග්‍යයේ දැක්මට ගෙනයාමට හැකි වේවායි තමන් ප්‍රාර්ථනා කරන බව ද පැවසීය.

මීට අමතරව මාර්ග සංවර්ධනය කිරීමේ දී දේශපාලන ගැටලු මත නගර සභාවෙන් මුදල් ගැනීමට නොහැකි වී ඇති අතර, ආණ්ඩුවට ඉදිරිපත් කළ යෝජනාවලට මුදල් ගැනීමට ද නොහැකි වී ඇති බවත්, මෑතකදී එක් වසමකට ව්‍යාපෘතියක් කිරීම වෙනුවෙන් ලක්ෂ 20 බැගින් මන්ත්‍රීවරුන්ට ලබා දෙන බව පැවසුව ද පසුව එම ලක්ෂ 20 වසමේ සියලු මන්ත්‍රීවරුන්ට බෙදී යන බව පැවසීමත් සමග යම් ගැටලුවකට මුහුණ දී ඇති බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා සභාවේ සිටින ඉදිරි මාස කිහිපය තුල දේශපාලන අර්බුදය කෙසේ වුවත් අවශ්‍ය අවස්ථාවල දී පක්ෂයක් ලෙස නොබලා අවශ්‍ය සහයෝගයක් ලබා දෙන බව ද තීන්දුවක් ගන්න අවස්ථාවේ දී නොබියව තීන්දුව ගන්නා ලෙස ද පවසන ලදී. එමෙන්ම රැකියා ලක්ෂය සඳහා බඳවාගත් පිරිසකට මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා දී තිබුණු අතර, එහි ප්‍රගතියක් දක්නට ලැබෙන බවත්, තුඹගොඩ වසමෙහි වැඩිපුරම මත්ද්‍රව්‍ය සඳහා යොමු වූ පිරිස් සිටින බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මෙම දැනුවත් කිරීම් සිදුවන බැවින් ගරු මන්ත්‍රීවරුන් මේ සම්බන්ධව දැනුවත් වන ලෙසත් පැවසීය.

තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා පැවසුවේ තමන් හට පාරක්වත් කාපට් කර ගැනීමට නොහැකි බව පැවසුව නමුත් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් තමන්ගේ පාර සාදා දීම පිළිබඳ ස්තුතිවන්ත වන බවයි.

**ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩට විශාල සංවර්ධනයක් මෙන්ම කීර්ති නාමයක් ලබාදුන් හිටපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිනී මල්ලිකා රත්වත්තේ මැතිතුමිය හා ක්ලිෆට් රත්වත්තේ මැතිතුමාගේ පුත්‍ර රත්නය වන කමල් රත්වත්තේ මැතිතුමාට බළන්ගොඩ නගර සභාවේ සියලුම නාගරික මන්ත්‍රීවරුන් හා බළන්ගොඩ ජනතාවගේ ශෝකය පළ කරන ලදී. එමෙන්ම මෙතුමා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ගරු සභාපති තනතුර හෙබ වූ අතර, දේශපාලන අධිකාරියේ ජනාධිපතිතුමන් සමඟ ඉතා සමීපව වැඩ කටයුතු කළ පුද්ගලයෙක් බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් එන්නත්කරණ වැඩසටහනේ දී ගරු නාගරික මන්ත්‍රීවරුන් වෙත ප්‍රමුඛතාවය ලබා දීමට නොහැකි වීම සම්බන්ධයෙන් සමා වන ලෙස පවසන ලදී.

එමෙන්ම කසළ එකතු කිරීම නිසියාකාරව සිදු නොවන බව ද දේශබන්දු මහතාගේ නිවස පාරේ සිට කොටුගොඩැල්ල පාර දක්වා අඩි පාරක් තමන්ගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් සකස් කළ නමුත් එහි අවසානයේ පවතින ගැට්ට හේතුවෙන් මිනිස්සුන්ට පැමිණීමට නොහැකි වී ඇති අතර, එය ඉවත් කර දෙන ලෙස ද අනුර මහතා වෙත පිළිතුරු ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වන බව ද පැවසීය. මීට අමතරව ක්‍රීඩාංගනය සම්බන්ධ ප්‍රශ්නයේ දී සියලු දෙනා එක්ව නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු බව ද පසුගිය දිනක කොමසාරිස්තුමා, ප්‍රධාන ඉංජිනේරුතුමා ඇතුළු නිලධාරීන් පැමිණි අතර, ප්‍රතිපාදන ලබා දීමට කැමැත්ත ලබා දුන් බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ක්‍රීඩාංගනයේ සිට මහජන පොළ දක්වා තිබුණු නැවතුම් ස්ථානය මඩ වී තිබුණු බැවින් ඒ බව කර්මාන්ත කමිටු ගරු සභාපතිතුමා හට පැවසීමෙන් අනතුරුව ඉටු කරලීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බව ද පවසන ලදී.

තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ඇවිදින මංතීරු ව්‍යාපෘතියත් සමඟ හෙළ බොජුන්හලක් ස්ථාපිත කිරීම සම්බන්ධව කළ ඉල්ලීමට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ අවදානය යොමුව ඇති නමුත් ඉඩමේ අයිතිය පිළිබඳ කෘෂිකර්ම

දෙපාර්තමේන්තුව සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර ගැටලුවක් පවතින බව ද අවශ්‍ය වුවහොත් ඔබතුමන්ලාගේ සහයෝගය බලාපොරත්තු වන බව ද පැවසීය.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පැවසූවේ හිටපු ආණ්ඩුකාරතුමිය කලින් ආරම්භ කළ තුරු උයනෙහි මෙය ඉදිකර දෙන ලෙස පැවසූ නමුත් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසූවේ මේ සඳහා අක්කර භාගයක් අවශ්‍ය බවයි.

**14. අවසානය**

**ගරු සභාපති චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

අද දින ගරු සභාව ඉතා සාමකාමීව සතුටින් සැහැල්ලුවෙන් පැවති අතර, හිටපු ගරු උප සභාපතිතුමා පැවසූ ආකාරයට පළාත් සභාවේ තීන්දු තීරණ අභියෝගයට ලක් කර ස්වාධීන ආයතනයක් වශයෙන් තීරණ ගැනීමට හැකි වූ නමුත් සභාපතිවරයා වශයෙන් තමන්ට නීත්‍යානුකූලව සිටිය යුතු අවස්ථාවක් පැවති බව ද පවසන ලදී. එමෙන්ම 1987 වර්ෂයෙන් පසුව පළාත් සභා ක්‍රමය යටතේ පළාත් සභාව හා ගරු ආණ්ඩුකාර බලතලවලට යටත්ව පළාත් පාලන ආයතන පරිපාලනය වන නමුත් ඊට පෙර අප ආයතන ඉතාම ස්වාධීන පරිපාලන ශක්තියක් තිබුණු ආයතන බව ද පැවසූ ගරු සභාපතිතුමා, අපේ කාර්යයන් තුල දී නිවැරදි දේ වැරදි ලෙසත් වැරදි දේ නිවැරදි ලෙසත් වශයෙන් දෙවිදියටම තීරණ ගනු ලබන අවස්ථා පවතින අතර, එහි දී පළාත් පාලන ආයතන අධීක්ෂණය වීමෙන් වැරදි දේ මඟ හැරෙන බවත් එය වාසියක් වුව ද ඇතැම් අවස්ථාවල දී ජනතාවගේ පැත්තෙන් අවාසියක් බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා තවදුරටත් අදහස් දක්වමින් ශ්‍රී ලංකාව දූපතක් වුව ද අවශ්‍ය අවස්ථාවල දී ගත යුතු තීරණ නොගත් බැවින් තවත් රටකින් පැමිණි කොවිඩ් 19 වසංගතයක් රට පුරා ව්‍යාප්ත වී ඇති බව ද මේ වන විට වසංගතය සාර්ථකව මැඩපවත්වාගෙන යන බවට අදහසක් පවතින නමුත් පසුගිය කාලයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් රාජකාරීවලින් බැහැර වූ නිසා දත්ත තොරතුරු නිවැරදිව වාර්තා නොවන බවක් තිබෙන බව ද ජනතාව ආර්ථිකව හෙම්බත් වී සිටින බැවින් එයින් මිදීමට රට යථා තත්ත්වයට පත් විය යුතු බව ද ඒ සඳහා කැපවෙන අතිගරු ජනාධිපතිතුමා ඇතුළු රජයටත්, නිලධාරීන්ටත් ස්තුතිවන්ත වන බව ද පැවසීය.

එමෙන්ම අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු උප සභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පලකරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.3.40ට පමණ අවසන් කරනලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.